# වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

# 2017


ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

## මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම



# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 1 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 0 | 0 |
| | වෛද්‍ය නිලධාරී | Primary Grade | SL-2-2016 | 1 | 0 | 0 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 3 | 1 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 8 | 2 |
| | අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 0 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 0 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 10 | 9 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 0 | 1 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 0 | 1 |
| | Software Developer | Dept | | 3 | 0 | 3 |
| | | | | **39** | **24** | **15** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 2 | 2 |
| | භාෂා පරිවර්තක සිංහල - ඉංග්‍රීසි 01<br>සිංහල - දෙමළ 01 | TS | MN-6-2016 | 2 | 2 | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 2 | 3 |
| | | | | **11** | **7** | **4** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 1 | 0 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 340 | 277 | 63 |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 398 | 371 | 27 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN-2-2016 | 190 | 115 | 75 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 2 | 3 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 130 | 11 |
| | Help Desk Operator | Dept. | | 2 | 0 | 2 |
| | | | | **1078** | **896** | **182** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 2 | 0 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-1-2016 | 4 | 4 | 0 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 12 | 0 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 46 | 10 |
| | | | | **75** | **68** | **7** |
| **එකතුව** | | | | **1209** | **1001** | **208** |

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | හැඳින්වීම | 1-7 |
| 02. | නව හඳුන්වාදීම් | 8-10 |
| 02. I | තොරතුරු තාක්ෂණික නවෝත්පාදන | 8-9 |
| 02. II. | විෂය ආශ්‍රිත නවෝත්පාදන | 9-10 |
| 03. | වැඩිදියුණු කිරීම් | 11-13 |
| 03. I | තොරතුරු තාක්ෂණික වැඩිදියුණු කිරීම් | 11 |
| 03. II | විෂය මූලික ක්‍රියාවලි සංවර්ධනය | 11-12 |
| 03. III | භෞතික නවීකරණයන් | 13 |
| 04. | සාධනයන් | 14-17 |
| 04. I | සත්කාර පියස | 14-15 |
| 04. II | මහජන දිනය | 15 |
| 04. III | මහජන කවුළු | 16 |
| 04.IV | අභ්‍යන්තර විගණනය | 16-17 |
| 05. | දැනුම් කළමනාකරණය | 18-21 |
| 05. I | තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණය | 18 |
| 05. II | අභ්‍යන්තර පුහුණු හා විදේශ් පුහුණු | 19-20 |
| 05. III | Friday Forum | 20-21 |
| 06. | වාර්ෂික සුභසාධන වැඩසටහන් | 22-24 |
| 06. I | ජාතික විශ්‍රාමික දින සැමරුම | 22 |
| 06. II | තාක්ෂණික සැසිය | 22-23 |
| 06. III | සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය | 23 |

| | | |
|---|---|---|
| | 06. IV මාධ්‍ය භාවිතය | 24 |
| 07. | මූල්‍ය සමාලෝචනය | 25-28 |
| | 07. I විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම | 25-26 |
| 08. | මූල්‍ය ප්‍රකාශන | 29-42 |

## හැඳින්වීම

වසර 1970.12.23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ දෙපාර්තමේන්තුවේ විෂය පථය ප්‍රධාන වශයෙන් විෂය තුනකින් සමන්විත වේ. එනම් 1934 පෙබරවාරි 05 දිනැති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කලින් කළ වූ යාවත්කාලීන කිරීම්වලට යටත්ව 1972 මැයි 05 දිනැති සංශෝධන ව්‍යවස්ථාව ප්‍රකාරව ගෙවීම් සිදු කරන විශ්‍රාම වැටුප් විෂය ද, 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතේ විවිධ යාවත්කාලීනවීම් වලට යටත්ව 2010 අංක 08 හා 09 දරණ සංශෝධනයන් බල පැවැත්වෙන පරිදි ගෙවීම් සිදු කරන වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් විෂය ද, 1942 අංක 18 දරණ ආඥා පනත ප්‍රකාරව බල පැවැත්වෙන පරිදි ගෙවීම් සිදු කෙරෙන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යන විෂය ත්‍රිත්වයයි.

නෛතික සීමාවන්ට යටත්ව මෙකී විෂය ත්‍රිත්වයේ සියලු ගෙවීම් හා අයකිරීම් නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරය වන අතර වසර 2017 දෙසැම්බර් මාසය වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔස්සේ විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමික ප්‍රජාව 600867 කි. එය වසර 2016 ට සාපේක්ෂව 3.6 % ක වැඩිවීමකි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ විෂය ක්‍රියාත්මක කිරීමේ පහසුව පිණිස අනු විෂයයන්ට බණ්ඩනය කර විවිධ අංශ මඟින් ඒ කටයුතු සිදු කිරීමටත්, සමස්ත ක්‍රියාවලිය සරල කිරීම උදෙසා නවීන තොරතුරු තාක්ෂණික උපක්‍රම භාවිත කිරීමත් සිදු වේ.

ඒ අනුව දිවයින පුරා සියලු රාජ්‍ය සේවකයන්ගේ හා සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා අවසන් ප්‍රතිලාභ ලබාදීම සඳහා වූ ලියාපදිංචි ක්‍රියාවලිය දෙපාර්තමේන්තු ලියාපදිංචි අංශය මඟින් සිදු කෙරේ. එහිදී විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත්‍ර පරීක්ෂා කර ලියාපදිංචි අංක ලබාදීමත්, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට අදාල විශ්‍රාමිකයා ඇතුළත් කර ප්‍රථම විශ්‍රාම වැටුප කඩිනමින් ගෙවීම ආරම්භ කිරීමත්, සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීම, විශේෂ වන්දි සහ වන්දි විශ්‍රාම වැටුප් ගෙවීම ඇතුළු විශ්‍රාමිකයාට හිමි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීමත් එකී අංශයෙන් සිදු වේ.


මෙහිදී විශ්‍රාම වැටුපට අයදුම්කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුවන බැවින් හා එහි ඇතිවිය හැකි අඩුපාඩු සියල්ල ද මාර්ගගත ක්‍රමයටම දැනුම්දීම සිදුවන බැවින් ලියාපදිංචි ක්‍රියාවලිය කඩිනම් හා නිර්වද්‍ය වූ ආකාරයකට විනිවිදභාවයෙන් යුතුව සිදුවේ.

**වගුව 01**

| විශ්‍රාම වැටුප් ලියාපදිංචිය | | | |
|---|---|---|---|
| මාසය | සිවිල් | හමුදා | එකතුව |
| ජනවාරි | 2049 | 142 | 2191 |
| පෙබරවාරි | 1660 | 68 | 1728 |
| මාර්තු | 1779 | 54 | 1833 |
| අප්‍රේල් | 1294 | 44 | 1338 |
| මැයි | 2335 | 61 | 2396 |
| ජූනි | 2539 | 126 | 2665 |
| ජූලි | 2490 | 305 | 2795 |
| අගෝස්තු | 2373 | 163 | 2536 |
| සැප්තැම්බර් | 1790 | 107 | 1897 |
| ඔක්තෝබර් | 1946 | 32 | 1978 |
| නොවැම්බර් | 1346 | 109 | 1455 |
| දෙසැම්බර් | 1908 | 87 | 1995 |
| එකතුව | **23509** | **1298** | **24807** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

ප්‍රස්ථාර 01




වගුව 02


| ප්‍රථම ගෙවීම් | |
|---|---|
| මාසය | සංඛ්‍යාව |
| ජනවාරි | 1633 |
| පෙබරවාරි | 2375 |
| මාර්තු | 1840 |
| අප්‍රේල් | 1929 |
| මැයි | 1309 |
| ජූනි | 1883 |
| ජූලි | 2223 |
| අගෝස්තු | 3222 |
| සැප්තැම්බර් | 3440 |
| ඔක්තෝබර් | 2740 |
| නොවැම්බර් | 2485 |
| දෙසැම්බර් | 2375 |
| එකතුව | **27454** |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

දැනටමත් විමධ්‍යගත නොකළ විශ්‍රාම වැටුප් වන විනය හේතුන් මත විශ්‍රාමය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාමය, ‘ට’ උපලේඛනගත නිලධාරීන්ගේ විශ්‍රාමය, රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදාහළ නිලධාරීන්ගේ විශ්‍රාමය වැනි මධ්‍යගත විශ්‍රාම වැටුප් ගණනය කිරීම හා ගෙවීම ගණන් බැලීමේ අංශය මඟින් සිදු වේ.

විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වූ විශ්‍රාමිකයකුට විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම සක්‍රිය කිරීමට පෙර විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රතිලාභ තහවුරු කර ගැනීම සඳහා සත්කාර පියස වෙත පැමිණීම 2015 ජූලි මාසයේ සිට අනිවාර්ය ය. මෙහිදී විශ්‍රාමිකයාගේ ඇවැමෙන් විශ්‍රාම වැටුප පිළිබඳ සියලුම ගැටලු නිරාකරණය කර ගැනීමේ අවස්ථාව ද උදා වේ. විශ්‍රාමිකයන් වෙනුවෙන් නිකුත් කරන විශ්‍රාමික හැඳුනුම්පත ලබාදීම හා අනෙකුත් සේවා පිළිබඳ දැනුම්වත් කිරීම ද මෙහිදී සිදු වේ.


ප්‍රස්ථාර 02




විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් කරනු ලබන සියලු ගෙවීම් සිදු වන්නේ ගිණුම් අංශය මඟිනි. එහිදී මාසික විශ්‍රාම වැටුප්

ගෙවීම් අංශය මඟින් සියලු විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබන අතර විශ්‍රාම වැටුප් හිමි අයවලුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුව ම මාසික විශ්‍රාම වැටුප ලැබෙන ආකාරයෙන් ගෙවීම් ක්‍රියාවලිය සිදුවේ. විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් අංශය මඟින් පාරිතෝෂක ගෙවීමත් විශ්‍රාමිකයන්ගෙන් රජයට විය යුතු අයවීම් අය කිරීමත් සිදු කෙරේ. එමෙන්ම වාර්ෂික ඇස්තමේන්තුව මඟින් වෙන් කරන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධ ගිණුම් පවත්වා ගැනීම ගිණුම් අංශය මඟින් සිදුවේ.

ප්‍රස්තාර 03




වගුව 03

| විශ්‍රාම වැටුප් ගෙවීම | | |
|---|---|---|
| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මාසික වියදම (රු.මිලියන) |
| ජනවාරි | 580336 | 14386.91 |
| පෙබරවාරි | 583273 | 14994.65 |
| මාර්තු | 584508 | 14807.06 |
| අප්‍රේල් | 585670 | 14828.75 |
| මැයි | 586012 | 14660.22 |
| ජූනි | 587083 | 14886.29 |
| ජූලි | 588857 | 15208.86 |
| අගෝස්තු | 591486 | 15510.34 |
| සැප්තැම්බර් | 593859 | 15667.28 |
| ඔක්තෝබර් | 596301 | 15347.69 |
| නොවැම්බර් | 598488 | 15629.53 |
| දෙසැම්බර් | 600867 | 16079.95 |
| එකතුව | | **181007.53** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

වැන්දඹු අනත්දරු විෂය සම්බන්ධව වගකීම් දරණ වැන්දඹු අනත්දරු අංශය විසින් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබන්නා වූ රාජ්‍ය නිලධාරීන් වැන්දඹු අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි කිරීම මියගිය රාජ්‍ය සේවකයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික ගෙවීම හා කලත්‍රයන්, අනත්දරුවන් හා ආබාධිත දරුවන් වෙත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම යන ක්‍රියාවලි සිදු කරනු ලැබේ. මෙහිදී රාජ්‍ය නිලධාරීන් වැන්දඹු අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුවේ.

වගුව 04

| වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව | |
|---|---|
| මාසය | සංඛ්‍යාව |
| ජනවාරි | 187126 |
| පෙබරවාරි | 187340 |
| මාර්තු | 187456 |
| අප්‍රේල් | 187538 |
| මැයි | 187517 |
| ජූනි | 187640 |
| ජූලි | 187959 |
| අගෝස්තු | 188340 |
| සැප්තැම්බර් | 188508 |
| ඔක්තෝබර් | 188997 |
| නොවැම්බර් | 189337 |
| දෙසැම්බර් | 189684 |

මූලාශ්‍රය - වැන්දඹු අනත්දරු අංශය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ නිරතව සිට විශ්‍රාම ලබා වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය ලබා වසර දෙකකට වැඩි කාලයක් විදෙස්ගතව සිටින විශ්‍රාමිකයන් වෙත අදාල වන නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව ඔවුන් හට කිසිදු අපහසුතාවකින් තොරව සිය විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අවශ්‍ය නිරවද්‍ය ක්‍රියාවලිය මෙහෙයවීම විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් සිදු කෙරේ.

1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතට අයත් වන විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයන් උදෙසා සේවා අවසාන ප්‍රතිලාභ තහවුරු කර ගෙවීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මඟින් සිදු කෙරේ. එහිදී විවිධ දෙපාර්තමේන්තු හා විදේශ තානාපති කාර්යාල වල සේවය කරන විශ්‍රාම වැටුප් අහිමි රාජ්‍ය සේවකයන්ගෙන් මාසික වැටුපෙන් 8% ක දායක මුදලක් නිසි පරිදි අරමුදලට බැර කර ගැනීමත් දායකත්වය අවසන් වන නිලධාරීන් වෙත කඩිනමින් නිරවද්‍ය ලෙස ප්‍රතිලාභ ගෙවීමත් මේ අංශය මඟින් සිදු වන අතර එහිදී අරමුදලට එකතු වන හා අතිරික්ත වන මුදල් දායකයන්ට වැඩි පොලියක් ගෙවිය හැකි පරිදි රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම හා වසර අවසානයේ පොලිය සාමාජිකයන්ට විසර්ජනය කිරීමත් මෙහිදී සිදු වේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ සියළු කාර්යයන්හිදී වෙනත් ආයතන සමඟ සිදු කෙරෙන ලේඛණ හුවමාරුවකදී ම ඒ සඳහා මැදිහත්කරු ලෙස කටයුතු කරන්නේ දෙපාර්තමේන්තු තැපැල් අංශයයි. දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි තැපෑල, සාමාන්‍ය තැපෑල හා අතින් දෛනිකව ලැබෙන ලිපි 1200ක පමණ ප්‍රමාණය විෂය අනුව වර්ග කර පරිලෝකනය කර තොරතුරු තාක්ෂණික දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීම මෙහිදී සිදු වේ. එමෙන් ම දෙපාර්තමේන්තුව මඟින් වෙනත් ආයතන වෙත දෛනිකව යොමු කරන 1000ත් 1500ත් අතර ලිපි ප්‍රමාණය ලේඛනගත කර ලියාපදිංචි, සාමාන්‍ය හෝ අතින් යන ක්‍රමවේද තුනෙන් අදාල ක්‍රමය අනුගමනය කර අදාල ආයතන වෙත යොමු කිරීම සිදු වේ. එහිදී සාමාන්‍ය තැපැල තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත විධිමත් පිරිදි යොමු කිරීම සිදුවේ.දෙපාර්තමේනතුව තුළ සිදුවන සියලු තොරතුරු ක්ෂණික භාවිතාවන් සඳහා අවශ්‍ය වන මෘදුකාංග නිර්මාණය කිරීම හා එකී මෘදුකාංග භාවිතය පිළිබඳ පුහුණු කිරීම, අභ්‍යන්තර මෘදුකාංග සංවර්ධන නිලධාරී මඩුල්ලක් මඟින් සිදුකිරීම තොරතුරු තාක්ෂණ අංශය මඟින් නියාමනය කෙරේ. තවද පරිගණක දෘඩාංග අලුත්වැඩියා කිරීම හා තොරතුරු තාක්ෂණික ගැටලු නිරාකරණය කිරීම ද තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු වේ. එමෙන් ම දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පවත්වාගෙන යාම ද එම අංශය සතු කාර්යභාරයකි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම පාලන අංශය මඟින් සිදු වේ. එහිදී මානව සම්පත් කළමනාකරණය යටතේ මානව සම්පත පුහුණු කිරීම, තොරතුරු පනතට අදාල තොරතුරු සැපයීම ආදී රාජකාරී සිදු කිරීම, දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා විශ්‍රාමික සංගම් සම්බන්ධීකරණය කිරීම සිදු වේ. භෞතික සම්පත් සංවර්ධනයේදී දෙපාර්තමේන්තුවේ සියලු ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ද දෙපාර්තමේන්තුව වෙත විවිධ සේවා සැපයීම ඒ සඳහා අදාල ආයතන වෙත ගෙවීම් සිදු කිරීම ද වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම, දෙපාර්තමේන්තුව සතු අමතර ඉඩකඩ කුලී පදනම මත වෙනත් ආයතන වෙත ලබාදීම හා කුලී අයකිරීම මෙන් ම දෙපාර්තමේන්තුව සතු නිවාඩු නිකේතන පාලනය කිරීම ද පාලන අංශය මඟින් සිදු කෙරේ.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය


වගුව **05**

| නිවාඩු නිකේතන ආදායම | |
|---|---|
| නිවාඩු නිකේතනය | ආදායම (රු.) |
| කැලණිය නිවාඩු නිකේතනය | 6,970,300.00 |
| රම්බොඩ නිවාඩු නිකේතනය | 359,425.00 |
| මුළු ආදායම | **7,329,725.00** |

මූලාශ්‍රය - පාලන අංශය

වගුව 06 ප්‍රස්තාර 04

| ආයතනයේ නම | බිම් ප්‍රමාණය % | ගොඩනැගිලි කුලී ලැබීම් (රු ) |
|---|---|---|
| හයිලන්ඩ් කිරිහල | 0.48 | 94,500 |
| සම්පත් බැංකුව A T M | 1.03 | 264,000 |
| හැටන් නැෂනල් බැංකුව | 8.3 | 2,050,000 |
| හැටන් නැෂනල් බැංකුව ATM | 1.01 | 226,000 |
| රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ භාර අරමුදල | 0.5 | 136,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 14.33 | 2,850,000 |
| ලංකා හොස්පිට්ල් (පුද්) සමාගම | 1.51 | 300,000 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 6.11 | 1,560,000 |
| මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය | 32.69 | 8,150,000 |
| ආපන ශාලාව | 1.51 | 345,000 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) | 12.57 | 3,000,000 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය (බ.ප.) | 15.84 | 3,465,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය II කොටස | 3.27 | 650,000 |
| රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව | 0.42 | 240,000 |
| තැපැල් කාර්යාලය | 0.43 | 800,000 |
| එකතුව | **100** | **24,130,500** |




මූලාශ්‍රය - පාලන අංශය

මේ සියලු ක්‍රියාවලීන් රජයේ නෛතික ප්‍රතිපත්ති උල්ලංඝනය නොවන පරිදි වඩාත් නිරවද්‍ය වූත් විනිවිදභාවයෙන් යුක්ත වූත් සාධාරණ ක්‍රමවේදයකට සිදු කිරීම සඳහා වග බලා ගන්නා අතර එකී කටයුතු විමර්ශනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇත.

රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ සහතික කිරීම සඳහා කළමනාකරණයට සහභාගී වීමද විගණන අංශයේ කාර්යභාරය වේ. එමෙන්ම ආයතනික හා මූල්‍ය ක්‍රමවේද නිවැරදි ආකාරයට අනුගමනය කරමින් සම්පත් උපරිම ආකාරයෙන් යොදවන බවට තහවුරු කර ගැනීම හා අදාල චක්‍රලේඛයන්ට යටත්ව මූල්‍ය පාලනය සිදුවේද යන්න පරීක්ෂා කිරීම ඊට අමතරව සිදු වේ.

මෙසේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය හා සම්බන්ධ සංකීර්ණ වූ ක්‍රියාවලිය සරල කරමින් විවිධ අංශ යටතේ වගකීම් හා කාර්යයන් පවරමින් කඩිනමින් විනිවිදභාවයෙන් නිරවද්‍යතාවය ආරක්ෂා කර ගනිමින් සිදු කිරීමට හැකිවී ඇත.

## 02. නව හඳුන්වාදීම්

### 02. I. තොරතුරු තාක්ෂණික නවෝත්පාදන

වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල් ක්‍රමයට සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් ලියාපදිංචි වීම අනිවාර්ය වන අතර එකී ලියාපදිංචිය සඳහා මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වාදීමට වසර 2016 දීවිශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2015 අනුව හැකියාව ලැබිණි. ඒ අනුව මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වූ රාජ්‍ය සේවකයින්ගේ ඩිජිටල් දත්ත ගබඩාවක් නිර්මාණය වෙමින් පවතින අතර ඊට පෙර සිදු වූ ලියාපදිංචි කිරීම්වලට අදාලව ඩිජිටල් දත්ත පද්ධතියක් නිර්මාණය වී නැත. සියලු රාජ්‍ය සේවක සේවිකාවන්ගේ වැන්දඹු අනත්දරු තොරතුරු ඇතුළත් ඩිජිටල් දත්ත ගබඩාවක් සකසා ගැනීම මඟින් විශ්‍රාමික ප්‍රජාවටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවටත් සිය කටයුතු පහසු කර ගත හැකි බව හඳුනාගනු ලැබිණි. මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි නොවූ සියලුම පැරණි රාජ්‍ය සේවක සේවිකාවන් වැන්දඹු අනත්දරු අරමුදල් ක්‍රමයේ නැවත ලියාපදිංචි කිරීම 2017 වසරේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017 මඟින් ආරම්භ කරන ලදී. ඒ අනුව වැන්දඹු අනත්දරු නැවත ලියාපදිංචියට අදාල නව මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කළ අතර ඒ මඟින් දිවයිනේ සියලු ම රාජ්‍ය සේවක ප්‍රජාව වැන්දඹු අනත්දරු ක්‍රමයේ නැවත ලියාපදිංචි වීම මඟින් ඩිජිටල් දත්ත ගබඩාවක් නිර්මාණය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙමඟින් සියලු රාජ්‍ය සේවක සේවිකාවන්ට තමන්ගේ වැන්දඹු අනත්දරු ලිපි ගොනුවෙහි ඇති අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමටත් ගැටලු නිරාකරණය කර ගැනීමටත් හැකියාව ලැබේ.

ඉදිරි වර්ෂයන්හිදී විශ්‍රාම ලැබීමට නියමිත රාජ්‍ය නිලධාරීන් පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛනයක් පවත්වා ගැනීමටත් ඒ ඇසුරෙන් අයවැය ඇස්තමේන්තුව නිවැරදිව සකස් කර ගැනීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකියාව ලැබෙනු ඇත. මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැප්ටොප් පරිගණක සියයක් ලබා ගැනීම ද සිදු විය.

මේ වන තෙක් මාර්ගගත ක්‍රියාවලියට සම්බන්ධ නොවූ, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සාමාජික ලියාපදිංචිය සඳහා ද නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම සිදු විය. ඒ මඟින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වයේ ලියාපදිංචිය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කර ගැනීමට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 02/2017 මඟින් අවස්ථාව සලසා ඇති අතර අදාල සාමාජික තොරතුරු ඩිජිටල් දත්ත ගබඩාවක් ලෙස නඩත්තු කිරීමටත් හැකියාව ලැබේ.

එමෙන් ම චෙක්පත් පිළිබඳ විස්තර ද තොරතුරු තාක්ෂණ පද්ධතිය ඔස්සේ සිදු කිරීමට එහිදී හැකියාව ලැබිණි. ඒ අනුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබන සාමාජිකයින්ගේ ලියාපදිංචිය හා ගෙවීම් තොරතුරු විධිමත් පරිදි තොරතුරු පද්ධතියක යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. මෙය 2017 වසර අවසානයේ සිට ක්‍රියාත්මක වන අතර සාමාජිකයා රාජකාරී සිදු කරන ආයතනය මඟින් සාමාජිකයාගේ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමත් එක් එක් නිලධාරියාගේ මාසික වැටුපෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අයකරනු ලබන දායක මුදල් චෙක්පත් සහිතව මේ තොරතුරු පද්ධතියට අදාල ආයතනය විසින් ම ඇතුළත් කිරීමත් සිදු වේ. මේ ක්‍රමය මඟින් ඉදිරියේදී අදාල සාමාජිකයන්ට අවසාන ගිණුම් ප්‍රකාශයක් ලබාදීමට ඇති හැකියාව වර්ධනය කිරීමටත් මාසිකව දායක මුදල් අයවීම පිළිබඳව දත්ත ලබාගත හැකි වීමත් ඒ මඟින් ප්‍රතිලාභ ගෙවීමේදී සියලු අවකරණ නිරීක්ෂණය කරගත හැකිවීමත් ගෙවීම් ක්‍රියාවලියේදී වඩාත් පහසුවක් වනු

ඇත. එමෙන් ම මේ දත්ත පද්ධතිය මගින් ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව සඳහා මාසිකව මුදල් බැර කර ඇති හා නැති ආයතන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉතා පහසුවෙන් ලබා ගත හැකි වනු ඇත. තවද ප්‍රතිලාභ ගෙවීමේදී ද වැඩි කාර්යක්ෂමතාවයක් බලාපොරොත්තු විය හැකි ය. එමෙන් ම සාමාජිකයා සේවය කරන ආයතනය මඟින් ම ලියාපදිංචිය සිදු කර ගන්නා බැවින් නැවත එකී ආයතනයට හා සාමාජිකයා වෙත ලිපි මඟින් අංක දැනුම්දීම වැනි දීර්ඝ ක්‍රියාවලියකින් මිදී කටයුතු කිරීමට හැකි වේ.

මෙතෙක් පැවති ක්‍රමය අනුව ලියාපදිංචි වීමේදී ඉහත සඳහන් කළ ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි. එනම් ස්වයංක්‍රීය පරීක්ෂාවකින් අදාල තොරතුර නිරවද්‍යතාවයෙන් හා ඉක්මනින් ලබා ගැනීමට හැකියාව නොතිබුණි. එබැවින් මේ නව ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂමව හා සඵලදායී සේවාවක් උදෙසා වූ එළඹුමක් වේ.

මරණ පාරිතෝෂික ගෙවීම, වැන්දඹු හා අනත්දරු දායක මුදල් නැවත ගෙවීම, විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කර ගෙවීම වැනි ක්‍රියාවලි සඳහා නව පද්ධතීන් නිර්මාණය කිරීම ආරම්භ කර ඇති අතර ඒ පද්ධති තත්ත්ව පරීක්ෂාවකින් අනතුරුව ප්‍රධාන තොරතුරු තාක්ෂණික පද්ධතිය සමඟ සම්බන්ධ කරනු ඇත.

දෙපාර්තමේන්තුව තුළ සිදුවන මෙකී තොරතුරු තාක්ෂණික භාවිතාවන් ඔස්සේ වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීමට එහි යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුව පවතින බැවින් ඒ සඳහා ඉහළ ධාරිතාවයකින් යුතු sever පද්ධතියක් හා අන්තර්ජාල සම්බන්ධතාවයක් මිලදී ගැනීම ද මීට සමගාමීව සිදු විය.

## 02. II. විෂය ආශ්‍රිත නවෝත්පාදන

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ධාරාවේ විෂය ක්‍රියාවලියේ විවිධ නව්‍යතාවයන් සිදුකර සරල ක්‍රියාවලියක් මඟින් වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමට මේ වසර තුළ ඉලක්කයක් ගොඩනගාගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා බෙදා වෙන් කළ විවිධ අංශයන්හි ක්‍රියාවලිවල විවිධ වෙනස්කම් කිරීම මඟින් සමස්ත ක්‍රියාවලිය සරල කිරීමට හැකි විය.

ඒ අනුව වැන්දඹු අනත්දරු විෂය පථය හා මරණ පාරිතෝෂික ගෙවීමේ ක්‍රියාවලිය ඒකාබද්ධ කිරීම මගින් කාර්යාලයේ විවිධ අංශ අතර එකම ලිපි ගොනුව අවස්ථා ගණනාවක හුවමාරු වීම නිසා ඇති වන ප්‍රමාදයන් වළක්වා ගැනීමට හැකියාව ලැබිණි.

මානව සම්පත මනා ලෙස කළමනාකරණය කරමින් පවතින ක්‍රියාවලිය නව්‍යතාවට ලක් කිරීම ද ඒ අතර සිදු විය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී ගැටලු සහිත ලිපිගොනු හා ගැටලු රහිත ලිපිගොනු වෙන් කර විෂය භාර නිලධාරීන් වෙත වෙන වෙනම ලබාදී ගණනය කිරීම් සිදුකිරීම තුළින් ගැටලු සහිත ලිපිගොනු එකතු වී එකී ලිපිගොනු වල ගැටලු නිරාකරණය සඳහා සැලකිය යුතු කාලයක් ගත විය. මෙහිදී ලිපිගොනු ගොඩගැසීම නිසා සේවාව පිළිබඳව නිලධාරීන් තුළ ද අතෘප්තිකර බවක් ඇති වී තිබිණි. ඒ නිසා ගැටලු සහිත හා රහිත යන සියලු ලිපිගොනු ඒකාබද්ධ කර විෂයභාර නිලධාරීන් වෙත ලබාදීමත් එකී ගැටලු සහිත ලිපිගොනුවල රාජකාරී ද සාමාන්‍ය මට්ටමින් පවත්වා ගෙන යාමටත් කාර්යක්ෂමව අවසන් කිරීමටත් හැකියාව ලැබී ඇත. එමෙන් ම දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලිපිගොනු විෂයභාර නිළධාරීන් වෙත ලබාදීමෙන් එක් එක් නිලධාරියාට ලැබුණු ලිපිගොනු සංඛ්‍යාවේ වෙනසක් පැවතිණි. සමානව රාජකාරී බෙදී

නොගිය බැවින් වැඩිපුර ලිපිගොනු භාරවූ නිලධාරීන් භාරයේ ලිපිගොනු ඉතිරිවීමෙන් කාර්යක්ෂමතාවයේ ගැටලු ඇති විය. එහිදී සමානව ලිපිගොනු සියලු නිලධාරීන් වෙත ලබාදීම මඟින් එකී අවහිරතාවයන් මගහරවා ගැනීමට හැකියාව ලැබී ඇත.

තවද තැපැල් ශාඛාව මගින් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සියලු ම අයදුම්පත් වෙත තාවකාලික අංකයක් ලබාදෙන අතර එහිදී විවිධ වර්ගයේ අයදුම්පත් සඳහා එක ම වර්ගීකරණ අංකය යටතේ තාවකාලික අංක ලබාදීමෙන් අදාල විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුනාගැනීම අසීරු වන හෙයින් මේ සඳහා අලුත් වර්ගීකරණ අංකයක් අංක 13 සිට 26 දක්වා අංක මෙඟින් ලබාදීම සිදු කරන ලදී. ඒ මඟින් නිවැරදි අදාල අයදුම්පතේ විෂය හඳුනා ගැනීමට හැකියාව ලැබී ඇත.

ගිණුම් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන වසර 5 ට වඩා පැරණි ලේඛන සියල්ල පරිලෝකනය කර දත්ත ගබඩා කර ගැනීමෙන් පසුව ඉවත් කර දැමීමේ ව්‍යාපෘතියක් 2017 වසරේදී දියත් කළ අතර ඒ මඟින් අත්‍යාවශ්‍ය ලෙස ලිපි ලේඛන ගොඩගැසීම මගහරවා ගත හැකි විය.

## 03. වැඩිදියුණු කිරීම

### 03. I. තොරතුරු තාක්ෂණික වැඩිදියුණු කිරීම්

වසර 2016 දී ආරම්භ කරන ලද විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය 2017 වසර තුළදී තවදුරටත් සංවර්ධනය කරමින් එය තව තවත් නවමු මාවත් වෙත විවර කිරීමට අවශ්‍ය පියවර ගැනුණි. එහිදී නැවත සේවයට එක් වූ හමුදා සාමාජිකයින් සඳහාද මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප් ලියාපදිංචිය ලබා ගැනීමට හැකියාව ලැබෙන පරිදි විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කරන ලදී. ඒ මඟින් එම නිලධාරීන් වෙත පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් ගෙවීම් කඩිනම් හා කාර්යක්ෂමව සිදු කිරීමට හැකිවිය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

අධිකරණ ක්ෂේත්‍රයේ විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමේදී පැවතුණු අවහිරතා සඳහා තාක්ෂණික විසඳුම් ලබාදීම ඇතුළු තොරතුරු තාක්ෂණික පද්ධති වැඩිදියුණු කිරීම් ද එහි දී සිදු විය.

නිල වෙබ් අඩවිය යාවත්කාලීන හා නවීකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් පරිභාහිර ස්ථානයක උපස්ථ (backup) පද්ධතියක් පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ සියලු රාජ්‍ය නිලධාරින්ගේ සහ සියලු විශ්‍රාමික ප්‍රජාවගේ වැන්දඹු අනත්දරු ලියාපදිංචියට අදාල ලිපිගොණු සියල්ල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ලේඛනාගාරයක සුරක්ෂිත කොට තබා තිබීම සිදුවන අතර ඒ ලිපිගොණු සංරක්ෂණය සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමටත් විශාල ඉඩකඩක් වෙන්කර තැබීමටත් සිදු වේ. මෙසේ වැන්දඹු අනත්දරු ලියාපදිංචියේ ලිපිගොනු ලක්ෂ 15 ක් පමණ දෙපාර්තමේන්තු ලේඛණාගාරයේ නඩත්තු වන අතර ඒ සඳහා වර්ග අඩි 10000ක් පමණ ඉඩ ප්‍රමාණයක් වෙන් කර ඇත. එමෙන් ම මීට අමතරව විශ්‍රාමිකයන් වෙත නිකුත් කළ ප්‍රදාන පත්‍ර ලක්ෂ 5 ක් පමණ මේ ලේඛණාගාරයේ ගබඩා කර ඇත. වසර 2017 දී මේ ලේඛණාගාරයේ ඇති ලේඛණ පරිලෝකනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර එහිදී ලක්ෂ 4 කට අධික විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර ප්‍රමාණයක් පරිලෝකනය කර අවසන් කළ හැකිව තිබේ.

### 03. II. විෂය මූලික ක්‍රියාවලි සංවර්ධනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය විෂය පථය ක්‍රියාත්මක කිරීමට අවසන් ක්‍රියාවලි වැඩිදියුණුකිරීම සිදු විය. ඒ අනුව මරණ පාරිතෝෂක ගෙවීම සම්බන්ධයෙන් ද පැවති ක්‍රමය වැඩිදියුණු කර කාර්යක්ෂම සේවාවක් සඳහා මෙකී ක්‍රියාවලි සංවර්ධනයක් සිදුවිය. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියයන හෝ විශ්‍රාම ගොස් වසරක් ඇතුළත මියයන නිලධාරීන් සඳහා මරණ පාරිතෝෂික ගෙවීමට සිදුවන අවස්ථාවන්හිදී මරණ පාරිතෝෂික අංක ලබාදීම අනුව අයදුම්පත්‍රය ලැබූ දිනට අදාලව සිදුකරනු ලැබූ අතර එය 2017 වර්ෂයේදී PD 05

ආකෘතිය අනුව දත්ත පද්ධතිය මඟින් අංක නිකුත් කිරීම දක්වා සංවර්ධනය විය.

වසර 2017 සිට විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයට අයවීම් ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කිරීමට කටයුතු සලසන ලදී. එහිදී පෙර පැවති ක්‍රමය අනුව පළාත් පාලන ආයතන නිලධාරීන්ගෙන් රජයට අයවීම් වලට අදාල මුදල් චෙක්පත් මඟින් පළාත් පාලන ආයතන වෙත යැවීම සිදු වූ අතර මධ්‍යම රජයට අදාල නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු මුදල් ප්‍රතිපාදන ලිපි යැවීම මගින් සිදු කරන ලදී. මේ ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කිරීම සඳහා පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන්ගේ පාරිතෝෂික ගෙවීම් සිදු කිරීමේදී අදාල නිලධාරියා සේවය කළ ආයතනයේ නිල බැංකු ගිණුම් අංකයට ලංකා බැංකුව, මහජන බැංකුව ඔස්සේ සෘජුවම අදාල අවකරණ මුදල තැන්පත් කිරීමට කටයුතු සිදුකෙරේ. මධ්‍යම රජයේ ආයතනයන්හි නිලධාරීන්ගේ පාරිතෝෂිකයන්හි අවකරණයන් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවි ඔස්සේ නිදහස් කිරීමට කටයුතු කෙරේ.

2017 වර්ෂය අවසානයේ ගණන් බැලීමේ අංශයේ ක්‍රියාවලිය ද විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීම සඳහා මූලික පද්ධති නිර්මාණ සැලසුම්කරණය සිදු කරන ලද අතර 2018 වර්ෂයේදී එය නිම කිරීමට බලාපොරොත්තු වේ.

විදෙස්ගත විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය වැඩිදුරටත් සංවර්ධනය කරමින් විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් එහි ක්‍රියාවලි සංවර්ධනය පුළුල් කරන ලදී. ඒ අනුව 2016 වසරේදී ආරම්භ කළ ලේඛණාගාරය සැකසීමේ කටයුතු විධිමත් පරිද 2017 වසරේදී අවසන් කළ අතර ඒ අනුව කඩිනමින් අවශ්‍ය ඕනෑම ලිපි ගොනුවක් සොයාගත හැකි වන අතර ඉදිරියේදී වර්ණ භාවිතාවක් මගින් ලිපිගොනුව තාවකාලික ලිපිගොනුවක් ද මුල් ලිපිගොනුවක ද යන්න තෝරා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කිරීමට නියමිත ය. ලේඛණාගාරයේ සියලු ලිපිගොනු පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කර පරිඝණකගත කර ඇති අතර එමඟින් අදාල ගොනුව ලේඛණාගාරයේ තැම්පත් කර ඇති ස්ථානය සොයා ගැනීමට ද පහසුකම් සලසා ඇත. විදෙස්ගත විශ්‍රාමික ප්‍රජාවගෙන් ලබා ගන්නා ජීවිත සහතිකයේ ආකෘතිය මඟින් ප්‍රමාණවත් පරිදි විශ්‍රාමික තොරතුරු ලබා ගැනීමට නොහැකි බව නිරීක්ෂණය වූ අතර වසර 2018 සඳහා විශ්‍රාමික තොරතුරු අවශ්‍ය පරිදි ලබා ගත හැකි ආකාරයේ ජීවිත සහතිකයක් සඳහා ආකෘති පත්‍රයක් නිර්මාණය කිරීමට හැකියාව ලැබිණි. එහිදී ජාතික හැඳුනුම්පත් අංකය, විදේශ ගමන් බලපත්‍ර අංකය එය නිකුත් කළ දිනය හා අවලංගු වන කාලසීමාව ද ජීවිත සහතිකයට ඇතුළත් කරන ලදී. එමෙන් ම සෑම වසරක ම ජීවිත සහතිකයක් ලබා දිය යුතු කාලසීමාව ද ඊට ම ඇතුළත් කර විශ්‍රාමිකයා තව දුරටත් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. වසර 2018 සිට ජීවිත සහතිකය ලබා දුන් බවට විශ්‍රාමිකයා වෙත තහවුරු කිරීමත් වශයෙන් රිසිට්පතක් ලබා දීමට ද කටයුතු සම්පාදනය කරන ලදී.

විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට පැමිණ සිය විශ්‍රාම වැටුප සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගැනීමටත් ජීවිත සහතික ලබා දීමටත් දිනපතා පැමිණෙන විශ්‍රාමික ප්‍රජාව වෙත වඩාත් සුහද සේවාවක් ලබා දීම උදෙසා සෑම දිනක ම පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා විදේශ විශ්‍රාම වැටුප් අංශයේ නිලධාරියෙකු ප්‍රධාන කවුළුව වෙත යොමු කිරීම ද වසර 2017 දී ආරම්භ කරන ලදී.

## 03. III. භෞතික නවීකරණයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ ගමන් මගත් සමඟ විශ්‍රාමික ප්‍රජාව ද ඒකාබද්ධ වෙමින් ඔවුන් ද සිය කටයුතු සම්ප්‍රදායිකත්වයෙන් නූතනත්වය දක්වා නවීකරණය කරගෙන ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පිවිසෙන විශ්‍රාමික ප්‍රජාවගේ නන්විධ අවශ්‍යතා එකම පියසක් යට දී සිදුකර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ රාජ්‍ය බැංකු හා පෞද්ගලික ආයතනයන් සඳහා විශ්‍රාමික ප්‍රජාව වෙත පිවිසීමට අවශ්‍ය මෙහෙයුම් කවුළු පෙළක් ස්ථාපිත කරන ලදී.



විදුලි ජනන යන්ත්‍රය - කැලණිය නිවාඩු නිකේතනය

මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පැමිණීම සටහන් කිරීමට නවීන තාක්ෂණයෙන් යුතු ඇඟිලි සලකුණු යන්ත්‍රයක් හඳුන්වා දීමටත් නිවාඩු කළමනාකරණ පද්ධතිය සඳහා වන මෘදුකාංගයක් හඳුන්වා දීමටත් හැකියාව ලැබුණි.

සත්කාර පියස වෙත පැමිණෙන විශ්‍රාමික ප්‍රජාවට වඩාත් පහසු හා සුහද සේවාවක් සැපයීමට හැකියාව ලැබෙන ආකාරයට සත්කාර පියස පිහිටි පරිශ්‍රය නවීකරණය කර නව මුහුණුවරකින් ස්ථාපිත කරන ලදී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දොරටුව ඉදිරිපිට තිබූ පැරණි වහලය හා ගොඩනැගිලි කොටස් ඉවත්කර අලංකාර නවීන වහලයක් ඉදි කිරීම ද සිදු විය. තවද කැලණිය විශ්‍රාමික නිවාඩු නිකේතනයට පැමිණෙන සේවාලාභීන් හට විදුලිය විසන්ධිවීමේදී වලදී අත්විඳීමට සිදු වන අපහසුතා මඟහරවා ගැනීම සඳහා නවීන ජෙනරේටරයක් සවි කිරීම ද වසර 2017 දී සිදුවිය.

# 04. සාධනයන්

## 04. I. සත්කාර පියස

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවත් ලක්ෂ හයකට අධික විශ්‍රාමික ප්‍රජාවත් එකිනෙකා හා යාවන්නේ දෙපාර්තමේන්තුවේ සත්කාර පියස ඔස්සේ ය. එනම් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වෙන සෑම රාජ්‍ය නිලධාරියෙකු ම එක්වරක් පැමිණිය යුතු වන්නේ සත්කාර පියස වෙතටයි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාම යාමට නියමිත නිලධාරියකු වෙත විශ්‍රාම වැටුප් අංකයක් නිකුත් කළ පසු ඔහු හෝ ඇය සත්කාර පියසේ සේවාව වෙත කැඳවීම් කරනු ලබයි. මෙකී සේවාව 2015 වසරේ ජූලි මස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද නවතම සංකල්පයක් විය. විශ්‍රාම දිවියට එළඹීමේ අභිප්‍රායෙන් සත්කාර පියසේ සෙවණට පැමිණෙන විශ්‍රාමිකයන් වෙත මෙමඟින් ගෞරවනීය සේවාවක් සැපයුණු අතර ඔවුන්ගේ විශ්‍රාම ගැටලු වෙත කඩිනම් විසඳුම් ලබා දීමට හැකියාව ලැබුණි. මෙහිදී විශ්‍රාමිකයන් සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වන අතර විශ්‍රාමිකයාගෙන් පසු වැටුපට හිමිකම් කියන කලත්‍රයා, අවුරුදු 26ට අඩු දරුවන් සහ ආබාධිත දරුවන් සිටී නම් ඔවුන්ගේ තොරතුරු ඇතුළත් වන විශ්‍රාමික හිමිකම් ප්‍රදාන පත්‍රය පිරිනමනු ලබයි. වැන්දඹු අනත්දරු ගොනුව පරිලෝකනය කර නැවත විශ්‍රාමිකයා වෙත ප්‍රදානය කිරීමත් විශ්‍රාමිකයන් වෙත අන්තර්ජාතික වටිනාකමින් යුතු හැඳුනුම්පතක් පිරිනැමීමත් සිදු වේ. 2017 වර්ෂයේදී සත්කාර පියස වෙත දිනකට කැඳවීම් කරන විශ්‍රාමිකයන් සංඛ්‍යාව 120 කි. 2016 වසරේදී දිනකට සත්කාර පියස වෙත කැඳවූ විශ්‍රාමිකයන් ගණන 50 කි. ඒ අනුව 2017 වර්ෂයේදී සත්කාර පියසට කැඳවූ විශ්‍රාමිකයන් ප්‍රමාණය දෙගුණයකින් වැඩි කිරීමට දෙපාර්තමේන්තු පරිපාලනය උත්සුක වූ අතර 2018 වර්ෂයේදී එය විශ්‍රාමිකයන් සංඛ්‍යාව 160 දක්වා වැඩි කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග මේ වන විට සකස් වෙමින් පවතී.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

සත්කාර පියස වෙත පැමිණෙන විශ්‍රාමිකයන් සඳහා නිකුත් කරන අන්තර්ජාතික වටිනාකමින් යුත් ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පත සඳහා ඇඟිලි සටහන් ලබාගැනීම අනිවාර්ය වූ අතර 2017 වර්ෂයේදී මෙතෙක් සිදු කළ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව කිරීම සඳහා ඇඟිලි සටහන් යන්ත්‍ර තුනක් සත්කාර පියස වෙත ලබාදෙන ලදී. එමඟින් ඇඟිලි සටහන් ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වූ අතර ප්‍රමාදයකින් තොරව විශ්‍රාමිකයාගේ ජීවදත්ත තොරතුරු ඇතුලත් අන්තර්ජාතික වටිනාකමකින් යුතු හැඳුනුම්පතක් ලබා දීමේ හැකියාව උදා වුණි.

සත්කාර පියස යනු සැදෑ සමයට එළඹි විශ්‍රාමිකයින් වෙත ගෞරවණීය සේවාවක් පිරිනමනු ලබන අංශය වේ. ඒ සඳහා පලපුරුදු ආචාරශීලී කාර්ය මණ්ඩලයක් පත් කිරීමට දෙපාර්තමේන්තු පරිපාලනය විසින් කටයුතු යොදා ඇති අතර එම නිලධාරීන්ගේ සාමූහික හැඟීම් හා එක්ව වැඩකිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා විශේෂ පුහුණු අවස්ථා ලබාදීම තුළින් වඩාත් කාර්යක්ෂම සමාජ සත්කාරයක් පවත්වාගෙන යාමට

දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී තිබේ. 2017 වසරේදී Dialog පුද්ගලික සමාගම හා එක්ව ලබා දුන් සේවාලාභී සත්කාරක පුහුණු වැඩමුළුවක් හා නායකත්ව පුහුණු වැඩසටහන් තුළින් ඔවුන්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට විශේෂ අවධානයක් යොමු කරන ලදී.

සත්කාර පියසෙන් විශ්‍රාමිකයාට ලබා දෙනු ලබන සේවාවෙන් කාර්යක්ෂමතාවය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගැනීම තුළින් 2017 වර්ෂයේ පූර්ණය වූ සාධනයන් මෙසේ ය. එනම් 2017 වර්ෂයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට නියමිත විශ්‍රාමිකයන් සඳහා සත්කාර පියස තුළ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා ප්‍රමාණය ( PMS Interviews ) 23,303 ක පමණ විශාල අගයක් වේ. අනෙකුත් සම්මුඛ සාකච්ඡා ප්‍රමාණය 3,099 කි. ඒ අනුව මෙම වර්ෂය තුළදී සත්කාර පියස ලබා කර ගත් මුළු ඉලක්ක ප්‍රමාණය සම්මුඛ සාකචඡා 26,402 ක් පමණ වේ.

### 04. II. මහජන දිනය

මහජන අවශ්‍යතාවයන් සහ ගැටලු අරබයා විසඳුම් ලබා දීම සඳහා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන "මහජන දිනය" නව මුහුණුවරකින් සහ නව දැක්මකින් යුතුව ක්‍රියාත්මක කිරීමට 2017 වර්ෂයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරීන්ගේ සුභසාධනය සහ සුරක්ෂිතතාවය වෙනුවෙන් කැපවූ රාජ්‍ය ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගැටලු සඳහා විසඳුම් ලබා දෙන්නා වූ මහජන දිනයේදී විශ්‍රාමිකයන් වෙත දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සෘජුව මුණගැසීමේ අවස්ථාව සැලසීම එම නව ක්‍රමවේදයයි. 2017.02.15 දින සිට මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කෙරිණි. මහජන දිනයේදී දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් එක් ස්ථානයකදී විශ්‍රාමිකයින් හමුවන අතර ඔවුන්ගේ ගැටලු සෘජුව දෙපාර්තමේන්තු පරිපාලන නිලධාරීන් වෙත යොමු කිරීමට මෙහිදී අවස්ථාව සැලසී තිබිණි. එකී අදාල ගැටලු සම්බන්ධයෙන් අදාල ශාඛා ප්‍රධානීන් විෂය නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් ඒ මොහොතේ ම ක්‍රියාත්මක වීම තුළ විශ්‍රාමිකයන්ට සිය ගැටළු සඳහා සාධාරණ පිළිතුරු ලබාදීමට හැකියාව ලැබුණු අතර මේ නව ක්‍රමවේදය තුළ දෙපාර්තමේන්තුව කරා දුර බැහැරින් පැමිණෙන විශ්‍රාමික සේවාලාභියාගේ විශ්වාසය තහවුරු කිරීමත් තෘප්තිමත් සේවාවක් ලබා දීමත් සිදුවිය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

ශාරීරික දුබලතාවයන් සහිතව දෙපාර්තමේන්තුවට පැමිණෙන විශ්‍රාමිකයන් ඒ ඒ අංශ සහ මහල් වෙත යාම අවම කර බිම්මහලේ දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදීම ඔවුනට විශ්‍රාම ගැටලු විසඳා ගැනීමට මෙමගින් අවස්ථාව හිමි කර දීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකිවී තිබේ.

## 04. III. මහජන කවුළු

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිලාභ ලබන විශ්‍රාමික ප්‍රජාව වෙත උපරිම සේවාවක් ලබාදීමට නිරන්තරයෙන් ඔවුන් වෙත ලබාදෙන සේවාවන් ගුණාත්මකව වෙනස්වීම්වලට ලක්කරන දෙපාර්තමේන්තුව මාණ්ඩලික නිලධාරීන් ඍජුව මුණගැසී ගැටලු ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබුණු "මහජන දිනය" සංකල්පයට ලැබුණු ප්‍රතිචාර අනුව තව දුරටත් ඉදිරියට යාමට 2017 වර්ෂයේදී කටයුතු කරන ලදී. ඒ අනුව විවිධ විශ්‍රාම වැටුප් අරඹයා දිවයිනේ සිව් දෙසින් දෙපාර්තමේන්තුව කරා පැමිණෙන විශ්‍රාමිකයන් හට මහජන දිනය වූ බදාදා දිනයට පමණක් සීමා නොවී සතියේ අනෙකුත් සෑම දිනක ම ඉදිරිපස මහජන කවුළුවෙහිදී සහකාර අධ්‍යක්ෂවරුන් සහ ගණකාධිකාරීවරුන් මුණගැසී සිය ගැටළු වෙත ක්ෂණික විසඳුම් ලබා ගැනීමට මෙමගින් අවස්ථාව උදා විය. සාමාන්‍යයෙන් විෂය භාර නිලධාරීන් වෙත යොමු වන විශ්‍රාමික ගැටලු මේ හරහා දෙපාර්තමේන්තු පරිපාලන නිලධාරීන් වෙත යොමු කිරීම මගින් විශ්‍රාමිකයා වෙත විනිවිදභාවයෙන් යුතු වූත් නිර්වද්‍ය වූත් සාධාරණ පිළිතුරු ලබාදී මේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත් වී තිබේ.

## 04. IV. අභ්‍යන්තර විගණනය

විශ්‍රාමික ප්‍රජාව, ඔවුන්ගේ කලත්‍රයන් සහ යැපෙන්නන් වෙත හිමි ප්‍රතිලාභ ලබා දීමේදී ඊට අදාල ආයතනික හා මූල්‍ය පද්ධතීන් පිළිබඳ ක්‍රියාවලිය වඩා පැහැදිලි, නිර්වද්‍ය සහ විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණනයෙන් ලැබෙන්නේ විශාල දායකත්වයකි. අභ්‍යන්තර විගණන පටිපාටිය තුළ 2017 වසරේදී විගණනයට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව 05 කි. ගත වූ වසර තුළ විශේෂ විගණන පරීක්ෂණ 9 ක් සිදු කරනු ලැබූ අතර දෙපාර්තමේන්තු අභ්‍යන්තර පරීක්ෂණ / දත්ත පද්ධති පරීක්ෂණ 37 ක් සිදු කරන ලදී. විගණනය කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව 45 කි. නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද පරීක්ෂා කරන ලද ලිපිගොනු සංඛ්‍යාව 180 ක් වේ. වර්ග සංකේත අංක / හැඳුනුම්පත් අංක නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා ගෙන්වා ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව 45 කි. ලක්ෂ 10 ට වැඩි හිඟ වැටුප් ලිපිගොනු පරීක්ෂණ 545 ක් සිදු කරනු ලැබූ අතර වර්ග අංකේත අංක 59 යටතේ ගෙවන ලද විශ්‍රාම වැටුප් ලිපිගොනු 1999 පරීක්ෂාව හා යුධ,ගුවන් හමුදා ඉදිරිපත් කර ඇති විශ්‍රාමිකයින් 17000 දෙනෙකු සම්බන්ධ දත්ත පද්ධති පරීක්ෂාව මඟින් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් අනාවරණය කර ගැනීම 2017 වර්ෂයට අදාලව සිදු කෙරුණු විගණන පරීක්ෂණ වේ.

2017 ට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක්, දත්ත පද්ධති 09 ක්, විශේෂ පරීක්ෂණ 39 ක් විගණන විමසුම් සිදු කෙරුණු අතර ලිපිගොනු 173 ක් සඳහා පරීක්ෂණ සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර විගණන අංශයට හැකියාව ලැබී තිබේ. විගණනයට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දත්ත පද්ධති පරීක්ෂාවෙන් 2017 වර්ෂයට අදාලව අනාවරණය කර ගත් වැඩිපුර මුදල් ගෙවීම් ප්‍රමාණය 22,223,839.15 ක් වේ.

එමෙන්ම අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා පරීක්ෂා කරන ලද ලක්ෂ 10 ට වැඩි ලිපිගොනු සංඛ්‍යාව හා සඳෙස් ලෙස හිඟ ගණනය කරන ලද ලිපිගොනු නිවැරදි කර නැවත යොමු කරන ලෙස දන්වා යවන ලද ලිපිගොනු සංඛ්‍යාව 611 ක් වේ. එකී ලක්ෂ 10 ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය වී ඇති නිවැරදි කරන ලද වැඩිපුර ගෙවීම් සංඛ්‍යාව මිලියන 1.8 ක් වේ.

දත්ත පද්ධති පරීක්ෂණයේදී අනාවරණය කර ගත් වැඩිපුර ගෙවීම් 3,960,261,018 ක් වන අතර විශේෂ පරීක්ෂණ මඟින් අනාවරණය කර ගත් වැඩිපුර ගෙවීම් 4,153,482.78 ක් වේ. අනාවරණය කර ගත් වැඩිපුර ගෙවීම් එක් එක් විශ්‍රාමිකයන්ගෙන් අයකර ගැනීම සඳහා ප්‍රධාන ගණකාධිකාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුම්වත් කරනු ලැබූ අතර වංචා සම්බන්ධ නීති මඟින් කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කිරීම මඟින් දෙපාර්තමේන්තු ගෙවීම් ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාමට 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයෙන් ලැබුණු දායකත්වය විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## 05. දැනුම් කළමනාකරණය

ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීම යන මූලික පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා දැනුම උපරිමව කළමනාකරණය කරනු ලබන රාජ්‍ය ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය. ලක්ෂ හයකට අධික විශ්‍රාමික ප්‍රජාවක් සමඟ ගනුදෙනු කිරීම වෙනුවෙන් ඔවුන් හා සබැඳි අති විශාල තොරතුරු සම්භාරය කළමනාකරණය කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශාල ප්‍රයත්නයක් දරණු ලබයි. එකී කර්තවයයේදී තොරතුරු ඒකරාශී කිරීම, සංවිධානය කිරීම, බෙදා හැරීම, නවෝත්පාදනයන් හා පද්ධති අඛණ්ඩව වැඩිදියුණු කිරීම ට ද 2017 වර්ෂයේදී ද පියවර ගනු ලැබී ය.

### 05. I. තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණය

සමස්ත විශ්‍රාමික ප්‍රජාව පිළිබඳ දත්ත මධ්‍යගත තොරතුරු පද්ධතියක් තුළ පවත්වාගෙන යමින් ආයතනික දැනුම කළමනාකරණය කිරීමේදී දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය දැවැන්ත භූමිකාවක් ඉටු කරනු ලබයි. විශේෂයෙන් ම දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය මෘදුකාංග නිපදවීමේ සිට දෙපාර්තමේන්තුව තුළ සියලු ම පරිඝණක දෝෂ නිවැරදි කිරීමේ දත්ත පද්ධති පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම හරහා සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව පවත්වා ගෙන යාමට 2017 වර්ෂයේදී ද තොරතුරු තාක්ෂණ අංශය දැඩි පරිශ්‍රමයක් දරණු ලැබී ය. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ වන විට මාර්ගගතව (Online) පවත්වාගෙන යනු ලබන සේවාවන් වන විශ්‍රාම වැටුප් ලියාපදිංචිය, දුම්රිය බලපත්‍ර වෙන්කිරීම, වැන්දඹු හා අනත්දරු නැවත ලියාපදිංචි කිරීම ආදී ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට අදාල පරිඝණක මෘදුකාංග විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය මඟින් නිපදවන ලද මෘදුකාංග වේ. දැනුම් කළමනාකරණයේදී එම මෘදුකාංග භාවිතය පිළිබඳ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව දීපව්‍යාප්ත දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක සේවය කරන විශ්‍රාම වැටුප් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් වරින් වර පවත්වනු ලබන දිවයිනේ වැඩිම විශ්‍රාමිකයන් පිරිසක් සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 54 ක් සහ දෙපාර්තමේන්තු ප්‍රධාන ශාඛාව වෙත ලැප්ටොප් පරිඝණක 100 ක් ලබාදීම මඟින් තොරතුරු පද්ධතිය වෙත ප්‍රවිශ්ට වීමේ ශක්‍යතාවයන් වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි.

එමෙන් ම විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගත කිරීම පිලිබඳව සහ වැන්දඹු අනත්දරු නැවත ලියාපදිංචි කිරීම පිලිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය හා සහසම්බන්ධව කටයුතු කරනු ලබන 3000 කට අධික රාජ්‍ය ආයතන ප්‍රමාණයක රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම මඟින් ඔවුන් කාර්යක්ෂමව තොරතුරු පද්ධතිය හා යා කර ගැනිණි.

පුහුණු වැඩමුළු පැවැත්වීමට අමතරව දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය ඔස්සේ මාර්ගෝපදේශ සංග්‍රහ ප්‍රදර්ශනය කිරීම, IT HELP DESK සහ මෙකී මාර්ගගත ලියාපදිංචි කිරීම පිළිබඳ ගැටලු සමඟ සෘජුව දෙපාර්තමේන්තු හා සම්බන්ධ වන රාජ්‍ය නිලධාරීන්ට ක්ෂණික විසඳුම් ලබාදීම හරහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණය මත පදනම්ව කරනු ලැබූ නවීන හඳුන්වාදීම් පිලිබඳව අනෙකුත් රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීමට පියවර ගනු ලැබීය.

## 05. II. අභ්‍යන්තර පුහුණු සහ විදෙස් පුහුණු

ආයතනය තුළ දැනුම් කළමනාකරණයේදී දෙපාර්තමේන්තුවේ මානව සම්පත සතු දැනුම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබාදෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, නිලධාරීන් සතු විවිධ ශක්‍යතාවයන් දෙපාර්තමේන්තු සංවර්ධන ක්‍රියාවලියට යොදා ගන්නා අතරම එම දැනුම යාවත්කාලීන කරමින් වර්ධනය කිරීම සඳහා නිබඳව විවිධ පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීමට යුහුසුළු වේ. 2017 වර්ෂයේදී නිලධාරීන් 26 දෙනෙකු වෙත රාජකාරී අවශ්‍යතාවයන්ට අනුකූලව පුහුණු අවස්ථා ලබා දීමට ඒ අනුව හැකියාව ලැබිණි. ලක්ෂ 6 කට අධික විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික ගෙවීම් ප්‍රධානව රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම දිවියට ඇතුළත් කර ගන්නා ක්‍රියාවලියේ භාරදූර කර්තව්‍යයන් රැසක් ඉටු කරනු ලබන දෙපාර්තමේන්තු නිලධාරීන් කාර්යක්ෂම කිරීමටත් රාජ්‍ය සේවයට අදාලව විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ අවබෝධය හා දැනුම පෘථුල කිරීටත් මෙකී පුහුණු වැඩසටහන් ප්‍රබල දායකත්වයක් ලබා දුන් බව සඳහන් කළ යුතු ය. දුරස්ථ අධ්‍යාපන ඒකකය මඟින් ක්‍රියාත්මක කළ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ වැඩමුළුව ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයෙන් පවත්වනු ලැබූ හරිත ඵලදායිතාව පිලිබඳව එක් දින වැඩමුළුව, නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ වැඩමුළුව, ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය මඟින් ක්‍රියාත්මක කළ රාජකාරී ලිපි සහ සිංහල ලිඛිත භාෂා පිළිබඳ පාඨමාලාව, ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය මඟින් පවත්වනු ලැබූ සයිබර් ආරක්ෂාව පිළිබඳ කතිකාව, කාර්මික අධ්‍යාපන පුහුණු දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන ලද වත්කම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන, නිපුණතා සංවර්ධන අරමුදලෙන් පුහුණු නිලධාරීන් සඳහා සකස් කරන ලද දෙදින පුහුණු වැඩමුළු ඇතුලු පුහුණු අවස්ථා 2017 වර්ෂයේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ට සිය පරිපාලන හා කළමනාකරණ ඇතුළු ශක්‍යතා රැසක් වැඩිදියුණු කර ගැනීමට ලැබුණු මහඟු අවස්ථාවන් වේ.

ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් නිර්මාණය කිරීම උදෙසා නිරන්තරයෙන් කැපවීම් කරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු මානව සම්පත තුළ විවිධ ක්ෂේත්‍රයන් පිළබඳ පවතින දැනුම හා නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා දේශීය වශයෙන් මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ලැබෙන පුහුණු අවස්ථාවන්ද අතිශය වැදගත් වේ. දැනුම් කළමනාකරණයේදී දෙපාර්තමේන්තුවට හිමි වන අන්තර් ජාතික පුහුණු අවස්ථා සෑම වසරක ම මනාව කළමනාකරණය කරමින් අදාල නිලධාරීන් එකී පුහුණු සැසි සඳහා යොමු කරනු ලබයි. 2017 වර්ෂයේදී ද දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විදෙස් පුහුණු අවස්ථා සාර්ථකව කළමනාකරණය කර අදාල ක්ෂේත්‍රයන් හා සම්බන්ධ නිලධාරීන් සුදුසු පරිදි යොමු කිරීමට කටයුතු කරන ලදී.

ජනවාරි මස 22 සිට 23 දක්වා මැලේසියාව ආශ්‍රිතව කරුණු රජයේ නිළධාරීන් සඳහා අධ්‍යයන චාරිකාවක් සඳහා දෙපාර්තමේන්තු නිළධාරීන් සහභාගී කෙරිණි. සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය සමාජ ආරක්ෂණය පිළිබඳ පෙබරවාරි මස 15 සහ 16 දෙදින කොරියාවේ පැවැත්වුණු ජාත්‍යන්තර වැඩමුළුව සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගී වූයේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයා ය. ජූනි මස 12 සිට ජූනි 16 දක්වා වූ ඉන්දියාවෙහි පැවති රාජ්‍ය පරිපාලනය හා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා ප්‍රධාන ගණකාධිකාරීවරයා සහභාගී වූ අතර ජූනි 11 සිට ජූනි 17 දක්වා මැලේසියාවේ පැවති හැකියා වර්ධන වැඩසටහනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් විශ්‍රාම වැටුප්

අධ්‍යක්ෂ (සංවිධාන හා සංවර්ධන) සහභාගී විය. අගොස්තු 13 සිට අගොස්තු 19 දක්වා තායිලන්තයේ පැවති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය පිළිබඳ උපක්‍රම හා තීරණ ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා ද ගණකාධිකාරීවරයකු දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි විය.

දේශීය සහ අන්තර්ජාතික වශයෙන් මෙකී පුහුණු අවස්ථා තුළින් ලද අත්දැකීම් සහ දැනුම විශ්‍රාමික ප්‍රජාව වෙත පිරිනමනු ලබන සේවාවේ කාර්යක්ෂම බවත් ගුණාත්මක බවත් ඉහළ නැංවීමට සමත් වූ අතරම දෙපාර්තමේන්තුවේත් සමස්ත රාජ්‍ය සේවාවේත් දිගුකාලීන සංවර්ධනය සඳහා එකී දැනුම ඉවහල් වනු ඇත.

## 05. III. Friday Forum

කලාව, සාහිත්‍ය, රස වින්දනයට ආශක්ත ශක්‍යතාවන්ගෙන් යුතු විවිධ රස වින්දන පරාසයන් නියෝජනය කරන දෙපාර්තමේන්තු නිලධාරින්ගේ හැකියාවන් වර්ධනය සඳහාත් රාජකාරී විෂය ක්ෂේත්‍රයන් වෙත නිරන්තර අවධානය යොමු කරන නිලධාරින්ගේ මානසික ප්‍රබෝධය සහ ලිහිල් භාවය උදෙසාත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නිර්මාණය කරන ලද සුවිශේෂී සංකල්පය "Friday Forum" නම් වේ.

මෙය විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නිපුණතාවය ලැබූ විද්වතුන්, විශේෂඥයන්, ප්‍රවීණයන්, කලාකරුවන් සතු දැනුම් සම්භාරය තුලින් දෙපාර්තමේන්තු නිලධාරින්ගේ දැනුම හා රසවින්දන හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් දේශන, වැඩමුළු සහ විනෝදාස්වාද වැඩසටහන් ආදී විවිධ හැඩතලයන්ගෙන් යුතුව නිර්මාණය කරන ලද දැනුම් කළමනාකරණ අංගයකි.

එක් මසක දී එක් වැඩසටහනක් ලෙස සැලසුම් කරමින් 2017 වර්ෂයේ දී Friday Forum වැඩසටහන සඳහා විද්වතුන් රැසකගේ දායකත්වය ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි. 2017 වර්ෂය සඳහා Friday Forum වැඩසටහන් 8 ක් දෙපාර්තමේන්තුවේ ඒ ඒ අංශ මඟින් සංවිධානය කරනු ලැබූ අතර 2017.01.20 වන දින නිශ්ශංක දිද්දෙණිය මහතාත් 2017.03.17 වන දින සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා අනූෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මියත් සහභාගී වෙමින් කලාව, සාහිත්‍ය, රාජ්‍ය සේවය යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ අපූරු කතිකාවක් ගොඩ නගනු ලැබිය. 2017.05.26 දින ප්‍රවීන ලේඛක චූලානන්ද සමරනායක මහතා නූතන කවියේ සමාජ විචාර යන මැයෙන් පැවැත්වූ දේශනයේදී කවියෙන් සාහිත්‍ය පෝෂණය කරන රාජ්‍ය සේවයේ අප්‍රකට කවීන් සහ ඔවුන්ගේ නිර්මාණ පිළිබඳව හෙළිදරව් කරනු ලැබීය.

වස විසෙන් තොර දේශීය ආහාර රටාවක් ගොඩනැගීම පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කරනු ලැබුවේ 2017.06.16 වන දින පැවැත්වූ Friday Forum වැඩසටහන තුළිනි. සොබා දහමේ අපූරු නිර්මාණයන් හා එම නිර්මාණයන් ඇසුරින් ජීවිතය රස විඳන ආකාරය පිළිබඳ අපූර්ව අත්දැකීමක් ලබාදීමට හැකි විය. 2017.07.14 වන දින ෂර්ලි උපුල් කුමාර මහතා විසින් පැවැත් වූ වැඩසටහන අතිශය සාර්ථක වූ Friday Forum වැඩසටහනකි. නාට්‍ය ගීතයන්ගෙන් අමන්දානන්දයට පත් කරමින් සිය කලා ජීවිතයේ අත්දැකීම් බෙදා හදා ගත් 2017.08.11 වන දින ඉදිරිපත් කරනු ලැබූ Friday Forum වැඩසටහන නිලධාරීන් අතිශය වින්දනයට පත් කළ අතර 2017.09.08 දින මානසික සෞඛ්‍ය සඳහා රසවින්දනය භාවිතා කිරීම පිළිබඳ දෙසුමක් පැවැත්වූයේ වෛද්‍ය නාලක එල්. පඩිප්පෙරුම මහතා විසිනි. 2017.10.13 වන දින රසිකා නිල්මිණි මහත්මිය විසින්

සංගීතමය Friday Forum වැඩසටහනක් මගින් නිලධාරීන් රසාලිප්ත කරනු ලැබීය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

එකිනෙකට වෙනස් විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලැබූ විද්වතුන් හා කලාකරුවන් ඇසුරෙන් ලැබූ දැනුම වින්දනය ඔස්සේ රාජකාරී දිවියේ ඒකාකාරී බවින් මිදුනු නිලධාරීන්ගේ ප්‍රබෝධයට හේතු වූ අතරම එය ඔවුන් විසින් ඉටු කරනු ලබන ආයතනික කාර්යයන්හි කාර්යක්ෂමතාවයට ද උත්ප්‍රේරකයක් විය.

## 06. වාර්ෂික සුභසාධන වැඩසටහන්

### 06. I. ජාතික විශ්‍රාමික දින සැමරුම

වර්ෂ 2005 සිට සෑම වසරකම ඔක්තෝබර් 8 වන දිනට යෙදෙන ජාතික විශ්‍රාමික දින සැමරුම 2017 වසරේදී ද අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට යෙදිණි. දශක තුනක පමණ කාලයක් සිය ජීවිතයේ වටිනාම කාලය රාජ්‍ය සේවය වෙනුවෙන් කැපකර වර්තමානයේ විශ්‍රාම සුව විඳින උදාරතර පරපුරක් වෙත රාජ්‍ය මට්ටමින් හරසර පිදීම උදෙසා ජාතික විශ්‍රාමික දින සැමරුම පැවැත්වෙන්නේ ය.

වසර 2017 ජාතික විශ්‍රාමික දින සැමරුම " විශ්‍රාමයට සවියක් " යන තේමාව යටතේ දීප ව්‍යාප්ත සැමරුම් උළෙලක් ලෙස පැවැත්වුණි. සියලු විශ්‍රාමික ප්‍රජාවගේ ජීවිතවලට විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගිය මහඟු සේවා රැසක් සපයමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සැබෑ සවියක් ලෙස ඔවුන්ගේ ජීවිත නගා සිටුවීම උදෙසා වූ දීප ව්‍යාප්ත කතිකාවක් ඒ ඔස්සේ ගොඩනගන ලදී. කොළඹට කේන්ද්‍රගත නොවී සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වන පරිදි පළාත් මට්ටමින් මෙම උළෙල සංවිධානය වූ අතර එහිදී සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් ද මේ උළෙල සංවිධානය සඳහා මහත් උනන්දුවකින් පෙළගැසී සිටියහ. එමෙන් ම ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටමෙන් විශ්‍රාමික සංගම් නියෝජනය කරමින් විශාල විශ්‍රාමික ප්‍රජාවක් මේ උළෙල නියෝජනය කෙරිණි. එහිදී විශ්‍රාමික ප්‍රජාව සතු විවිධ ශක්‍යතා එළිදක්වමින් ගායන, වාදන, නර්තන හා නාට්‍යමය අවස්ථා රැසකින් එකී සැමරුම් සියල්ල වර්ණවත් විය. එමෙන් ම විශ්‍රාමික ප්‍රජාව වෙත විවිධ සේවා සපයන වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන මඟින් ඒ ඒ උළෙලවලදී සිය දායකත්ව දක්වන ලද අතර විවිධ දේශන, වැඩමුළු, සෞඛ්‍ය කඳවුරු, නිර්මාණ එළිදැක්වීම් ආදී ලෙස ඒ ඒ පළාත්වලට ආවේනික ලෙස විවිධත්වයකින් යුතුව මේ උළෙල සංවිධානය විය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මෙහිදී දේශපාලන අධිකාරියේ සම්භාවණීය සහභාගිත්වයෙන් යුතුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි මෙහෙයවීමෙන් 2017 ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල දීප ව්‍යාප්තව පැවැත්වීමට හැකියාව ලැබිණි.

### 06. II. තාක්ෂණික සැසිය

වසර 2017 ජාතික විශ්‍රාමික දින උළෙලට සමගාමීව රටේ විද්වත් ප්‍රජාවගේ සහභාගිත්වයෙන් තාක්ෂණික සැසියක් 2017.11.10 දින Grand Oriental හෝටලයේදී පවත්වන ලදී. එයට ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා හා අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ.රත්නසිරි මහතා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආදී රජයේ උසස් නිලධාරීන් ද විද්වතුන් ද පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් ද සහභාගී විය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මෙම සැසියේදී විශ්‍රාමික ප්‍රජාව වෙත කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීම සඳහා නවීන තාක්ෂණික භාවිතය සිදුවිය යුත්තේ කුමන ආකාරයෙන් ද යන්නත් විශ්‍රාම වැටුප් විෂය මූලික මූලික කරුණු පිළිබඳවත් සමාජ ආරක්ෂණයක් ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමයේ අනාගත දිශානතීන් පිළිබඳවත් දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි. මෙහිදී රාජ්‍ය සේවයේ පරිනත නිලධාරීන් සමූහයක් ඉදිරියේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැඩපිළිවෙළ හා විෂය මූලික කාරණා සාකච්ඡාවට බඳුන් වීමෙන් ඔවුනොවුන්ගේ අදහස්, යෝජනා හා මත ගැටීම් ආදිය මධ්‍යයේ විශේෂිත දැනුම් සම්භාරයක් ගොඩනගා ගැනීමට අවකාශ උදාවිය. මෙහිදී ලබා ගන්නා ලද සියලු යෝජනා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි වැඩපිළිවෙල සකස් කිරීම සඳහා සාධනීය ලෙස යොදා ගැනීම සිදු වේ. මෙම තාක්ෂණික සැසිය සඳහා ලංකා බැංකුව පූර්ණ අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

## 06. III. සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය

දේශයේ උත්කර්ශවත් ම සංස්කෘතික මංගල්‍යය වන සිංහල දෙමළ අලුත් අවුරුදු උළෙලට සමගාමීව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ද සංස්කෘතික දායාදයන් පෙරටු කර ගනිමින් උත්කර්ශවත් අන්දමින් 2017.04.22 දින සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය කැලණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතන භූමියේදී පැවැත්විණ. මේ උළෙලෙහි විශේෂත්වය වූයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරී මණ්ඩලය හා ඔවුන්ගේ පවුල් වල අයවලුන් සමඟ විශ්‍රාමික ප්‍රජාව ද සහභාගී වීම ය. සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ට මුල් තැන ලබා දෙමින් සහභාගී වන සියලු දෙනා අතර සුහදතාවය වර්ධනය වන ආකාරයට මේ උළෙල සංවිධානය කෙරිණි. මෙහිදී සහභාගී වූ කුඩා දරුවන් වෙනුවෙන් වෙන ම තරඟ ද වැඩිහිටියන් හා විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් වෙනම තරඟ ද සංවිධානය කෙරිණි. විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් විවිධ සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි නොමසුරු දායකත්වය ද මෙහිදී ලැබුණු අතර එකී ආයතන නියෝජනය කරමින් නිලධාරීන් රැසක් ද සහභාගී විය. එමෙන් ම මේ උත්සව අවස්ථාවේ සියලු රසබර අවස්ථා එසැනින් දෙපාර්තමේන්තු නිල facebook අඩවිය ඔස්සේ ප්‍රචාරය කිරීම ද දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මගින් සිදු විය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 06. IV. මාධ්‍ය භාවිතාව

විශ්‍රාමික ප්‍රජාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සමීප කරමින් නවීන මාධ්‍ය භාවිතාවක් ඇසුරින් විශ්‍රාමික ප්‍රජාව වෙත එළඹීම 2017 වසර තුළදී ද සිදුවිය. විවිධ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් විශ්‍රාමික ප්‍රජාව දැනුම්වත් කිරීම් මඟින් සමස්ත රාජ්‍ය සේවයටත් විශ්‍රාමික ප්‍රජාවටත් කඩිනම් සන්නිවේදන සේවාවක් සැපයීමට හැකි විය. දෙපාර්තමේන්තුව ප්‍රධාන මාධ්‍ය වශයෙන් නිල වෙබ් අඩවිය, අදාල චක්‍රලේඛ හා විශේෂ ලිපි, සංඛ්‍යාලේඛණ දත්ත විශ්‍රාම වැටුප් ගෙවීම් විස්තර, විශේෂ දැනුම්දීම් ආදිය මෙන් ම මාර්ගගත සේවාවන්ට පිවිසීමේ කවුළු ආදියෙන් සමන්විතව නිරන්තරව යාවත්කාලීන කරමින් පවත්වාගෙන යන ලදී. එමෙන් ම සමාජජාලා වෙබ් අඩවි ලෙස දෙපාර්තමේන්තු නිල facebook අඩවිය හා youtube වෙබ් අඩවිය ඔස්සේ දෙපාර්තමේන්තුවේ තොරතුරු හා වැඩසටහන් සමාජගත කිරීම ද සිදු විය.

එසේ ම විශ්‍රාමික ප්‍රජාව හා සමස්ත රාජ්‍ය සේවක ප්‍රජාව කේන්ද්‍රකර ගනිමින් සමස්ත සමාජය ම ඉලක්ක කර සංස්කරණය වන " විශ්‍රාම " අන්තර්ජාල සඟරාව 2017 වසර පුරා මාසිකව නිල වෙබ් අඩවිය සහ නිල facebook අඩවියේ පළවිය. එහිදී ආර්ථික, සෞඛ්‍ය, නිර්මාණාත්මක සහ සමාජ යන අංශ නියෝජනය කරමින් විශ්‍රාමික ප්‍රජාවගේත් උගතුන්ගේත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේත් හරවත් ලිපි රාශියකින් මේ සඟරාව සංස්කරණය විය.

" විශ්‍රාම රේඩියෝව " අන්තර්ජාල ගුවන්විදුලිය ද අන්තර්ජාලයට මුදා හරිමින් ශ්‍රාවක ප්‍රජාව වෙත සුභාවිත ගී රසවින්දනය, සමාජීය තොරතුරු ඇතුළත් වැඩසටහන්, සෞඛ්‍ය වැඩසටහන්, රස වින්දන වැඩසටහන් සහ ප්‍රවෘත්ති වාර්තා වැඩසටහන් ඇසුරින් උසස් රසවින්දනයක් ලබා දීමට 2017 වසර තුළදී හැකි විය.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 07. මූල්‍ය සමාලෝචනය

විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් ගේ සමාජ සුරක්ෂණය සැලසීමේ ප්‍රමුඛතම ව්‍යාපෘතිය වන විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සහ මාසික විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා රජයේ වාර්ෂික අයවැය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙම ප්‍රතිපාදන සැලසීමේ දි විශ්‍රාමිකයින් සඳහා එකවර ගෙවන විශ්‍රාම පාරිතෝෂිකය, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම, විශ්‍රාමිකයින් ගේ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ මිය ගිය සහ අබාධිත රණවිරුවන් ගේ වැටුප් හා දීමනා ගෙවීම සහ එකී ක්‍රියාවලිය කළමනාකරණය සහ පරිපාලනය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. විශ්‍රාම වැටුප් සඳහා දරණ වියදම ආර්ථිකමය වශයෙන් රජයට වැය බරක් වුවත්, එමගින් ඍජුව ආර්ථික ප්‍රතිලාභයක් රජයට නොලැබේ. එසේ වුව ද වසර 30 කට අධික කාලයක් තම ශ්‍රමය කැප කරමින් රටේ සංවර්ධනයට උර දුන් රජයේ නිලධාරීන් ලෙස සේවය කළ විශ්‍රාමිකයන් ගේ සමාජ සුරක්ෂණය සැලසීම රජයේ වගකීම වන බැවින්, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම සඳහා රජය අඛණ්ඩව ප්‍රතිපාදන සලසයි.

විශ්‍රාමික ප්‍රජාවගේ උපනතිය සැළකූ විට වාර්ෂික 23,000 කට ආසන්න නව විශ්‍රාමික ප්‍රමාණයක් එකතු වෙමින් , විශ්‍රාමික ගහණයේ අඛණ්ඩ වර්ධනයක් දැකිය හැක. විශ්‍රාමිකයන් මිය යාම මාසිකව 1200 කට අගයක් ගනු ලැබුවත්, එම පිරිසෙන් 700 කට ආසන්න ප්‍රමාණයක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපට හිමිකම් කියනු ලැබේ. එබැවින් සිවිල් විශ්‍රාමිකයන් මිය ගිය ද , ඔවුන් ගේ වැන්දඹුවන් , අනත්දරුවන් සහ ආබාධිත දරුවන් ට හිමිකම විතැන් වන බැවින්, විශ්‍රාමික ගහණයේ අඛණ්ඩ වැඩිවීමක් මිස අඩු වීමක් බලාපොරොත්තු විය නොහැකි ය.

වගුව 07

| මාසය | මාසික වියදම් (රු.මිලියන) |
|---|---|
| ජනවාරි | 14,386.91 |
| පෙබරවාරි | 14,994.65 |
| මාර්තු | 14,807.06 |
| අප්‍රේල් | 14,828.75 |
| මැයි | 14,660.22 |
| ජුනි | 14,886.29 |
| ජුලි | 15,208.86 |
| අගෝස්තු | 15,510.34 |
| සැප්තැම්බර් | 15,667.28 |
| ඔක්තෝබර් | 15,347.69 |
| නොවැම්බර් | 15,629.53 |
| දෙසැම්බර් | 16,079.95 |
| එකතුව | **182,007.53** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

### 07.I විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම

විශ්‍රාම යන සෑම රජයේ නිලධාරියකු ම ඔහු අවසාන වරට ලබා ගත් වැටුප සහ සේවා කාලය පදනම්ව මාස 24 ක අඩුනොකල විශ්‍රාම වැටුපට සමාන පාරිතෝෂිකයකට හිමිකම ලැබේ. මාසිකව විශ්‍රාම ගනු ලබන 2,000 කට අධික විශ්‍රාමික සංඛ්‍යාවට පාරිතෝෂික ගෙවීම සඳහා රුපියල් මිලියන 2,000 කට ආසන්න මුදලක් වැය වේ. 2017 වර්ෂයේදී නව විශ්‍රාමිකයින් 26305 ක සංඛ්‍යාවක් රු.මිලියන 18753 ක පාරිතෝෂික මුදලක් ගෙවා ඇත. 2014 වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා භාණ්ඩාගාරය ඍජුව මුදල් සැපයුම සිදු නොකරන අතර, ඒ සඳහා රාජ්‍ය බැංකු ( 03) තුන මගින් චක්‍රීය ණය පහසුකම් සලසා එමගින් පාරිතෝෂික ගෙවනු ලබයි. ඒ සඳහා මහා භාණ්ඩාගාරය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය බැංකු එකඟතාවයකට පැමිණ ඇත. ඒ අනුව

2014 සිට 2017 දෙසැම්බර් මස අවසානය දක්වා පාරිතෝෂික ගෙවීම සඳහා රාජ්‍ය බැංකු තුන (03) මඟින් ලබාගත් සමස්ත චක්‍රිය ණය පහසුකම රුපියල් මිලියන 50,592 කි. මෙම ණය මුදල කාලීනව වෙනස් වන පොළී අනුපාතයන් මත ලබා දී ඇත. ණය මුදල පියවීම ණය මුදල නිකුත් කළ දින සිට වර්ෂ 18 ක කාලයක් තුළ සිදු වේ. ණය මුදලේ මාසික වාරික හා ණය පොළී ගෙවීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා දී ඇත. ණය මුදල සහ පොළිය ක්‍රමිකව වැඩි වීමක් දැකිය හැකි ය. ණය මුදලේ වර්ධනය 2016 වසර හා සසඳන කල 53% ආසන්න අගයක් ගනී. 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය මගින් රාජ්‍ය සේවකයින් ගේ මූලික වැටුපෙහි කරන ලද සංශෝධනයන් සමග ගෙවිය යුතු පාරිතෝෂික මුදල ඉහල යාම මෙම වර්ධනයට හේතු වී ඇත. 2020 වර්ෂය වන විට සමස්ත වැටුප් වැඩිවීම 2016 වර්ෂය හා සසඳන කළ 107% වන බැවින් පාරිතෝෂිත ගෙවීම සඳහා ලබා ගන්නා ණය මුදලේ වර්ධනය 2017 හා සසඳන කල විශාල ප්‍රමාණයකින් වර්ධනය වීමත් සමග ඒ සඳහා ගෙවනු ලබන පොළියද ඉහළ යනු ඇත.

- මූල්‍ය සාරාංශය

වගුව 08

| විශ්‍රාම වැටුප් ගෙවීම | | |
|---|---|---|
| පළාත | ගෙවූ විශ්‍රාම වැටුප (රු.මිලියන) | විශ්‍රාමිකයන් සංඛ්‍යාව |
| උතුරු පළාත | 5,814.05 | 20,291 |
| වයඹ පළාත | 19,553.55 | 68,201 |
| බස්නාහිර පළාත | 62,928.22 | 213,787 |
| උතුරු මැද පළාත | 10,095.32 | 36,927 |
| මධ්‍යම පළාත | 22,128.88 | 77,205 |
| සබරගමුව පළාත | 13,734.25 | 47,992 |
| නැගෙනහිර පළාත | 6,481.56 | 23,568 |
| ඌව පළාත | 8,378.41 | 31,020 |
| දකුණු පළාත | 20,633.51 | 72,369 |
| එකතුව | **169,747.75** | **591,360** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

- පාරිතෝෂික ගෙවීම


වගුව 09

| පාරිතෝෂික ගෙවීම | | |
|---|---|---|
| පාරිතෝෂිකය | මුදල (රු.මිලියන) | සංඛ්‍යාව |
| සිවිල් | 17,094.17 | 24,097 |
| සන්නද්ධ සේවා | 1,658.64 | 2,208 |
| ගණන් බැලීම් | 481.63 | 1,426 |
| මරණ | 518.12 | 1,154 |
| වෙනත් * | 984.66 | 14,288 |
| එකතුව | **20,737.22** | **43,173** |


මූලාශ්‍රය - ගිණුම් අංශය

* සේවා පාරිතෝෂික, විශේෂ වන්දි, සංශෝධන පාරිතෝෂික

ප්‍රස්තාර 05




ප්‍රස්තාර 06




වගුව 10

| බැංකු අනුව පාරිතෝෂික ගෙවීම | | |
|---|---|---|
| බැංකුව | 2016 රු.මිලියන | 2017 රු.මිලියන |
| මහජන බැංකුව | 5,839.82 | 8,055.22 |
| ලංකා බැංකුව | 4,740.43 | 6,115.01 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,400.92 | 3,420.56 |
| එකතුව | **12,981.17** | **17,590.79** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ප්‍රස්තාර 07




- **සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම**


ක්‍රියාත්විතයේදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදාවේ හා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටි නිලධාරීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන් හට අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම සිදු කරනු ලබයි.

වගුව 11

| සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම | | |
|---|---|---|
| වියදම | සංඛ්‍යාව | රු.මිලියන |
| යුධ හමුදා | 35,599 | 24,717.32 |
| නාවික හමුදා | 1,385 | 982.33 |
| ගුවන් හමුදා | 534 | 404.48 |
| පොලීසිය | 2,471 | 1,705.67 |
| එකතුව | **39,989** | **27,809.80** |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ප්‍රස්තාර 08



# 08. මූල්‍ය ප්‍රකාශන

විසර්ජන ගිණුම

ඩී.ජී.එස්.ඒ - 1

වියදම් ශීර්ෂ අංකය: 253

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | (1+2+3) | | (4-5) |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1 | <u>පුනරාවර්තන</u> මෙහෙයුම් වැඩසටහන | - 209,473,089,000 | 1,403,030,800 | (6,651) | 210,876,113,149 | 210,064,887,765 | 811,225,384 |
| | උප එකතුව (පුනරාවර්තන) | **209,473,089,000** | **1,403,030,800** | **(6,651)** | **210,876,113,149** | **210,064,887,765** | **811,225,384** |
| 1 | <u>මූලධන</u> මෙහෙයුම් වැඩසටහන | - 23,750,000 | 7,000,000 | 6,651 | 30,756,651 | 28,575,804 | 2,180,847 |
| | උප එකතුව (මූලධන) | **23,750,000** | **7,000,000** | **6,651** | **30,756,651** | **28,575,804** | **2,180,847** |
| | මුළු එකතුව | **209,496,839,000** | **1,410,030,800** | **0** | **210,906,869,800** | **210,093,463,569** | **813,406,231** |

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම

ඩී.ජී.එස්.ඒ - 2

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 1 - මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 209,473,089,000 | 1,403,030,800 | (6,651) | 210,876,113,149 | 210,064,887,765 | 811,225,384 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 23,750,000 | 7,000,000 | 6,651 | 30,756,651 | 28,575,804 | 2,180,847 |
| එකතුව | 209,496,839,000 | 1,410,030,800 | 0 | 210,906,869,800 | 210,093,463,569 | 813,406,231 |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

**ඩී.ජී.එස්.ඒ - 3**

වියදම් ශීර්ෂ අංකය : **253** දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : **1** මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01. සාමාන්‍ය පරිපාලනය** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 40,500,000 | 0 | 17,225,345 | 57,725,345 | 57,188,825 | 536,520 |
| අනෙකුත් වියදම් | 39,650,000 | 0 | 1,478,051 | 41,128,051 | 41,073,447 | 54,604 |
| උප එකතුව | 80,150,000 | 0 | 18,703,396 | 98,853,396 | 98,262,272 | 591,124 |
| **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 408,200,000 | 0 | (8,800,000) | 399,400,000 | 399,293,125 | 106,875 |
| අනෙකුත් වියදම් | 208,984,739,000 | 1,403,030,800 | (9,910,047) | 210,377,859,753 | 209,567,332,369 | 810,527,384 |
| උප එකතුව | 209,392,939,000 | 1,403,030,800 | (18,710,047) | 210,777,259,753 | 209,966,625,493 | 810,634,260 |
| මුළු එකතුව | 209,473,089,000 | 1,403,030,800 | (6,651) | 210,876,113,149 | 210,064,887,765 | 811,225,384 |

## ව්‍යාපෘති අනුව මූලධන වියදම්

ඩී.ජී.එස්.ඒ - 4

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති අංකය හා නාමය : 1 සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් රු. | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම රු. | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් රු. | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) රු. | (5) මුළු වියදම රු. | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | <u>පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්</u> | | | | | | |
| 2001 | | 11 | ගොඩනැඟිලි හා ඉදිකිරීම් | 1,000,000 | 7,000,000 | 2,341,651 | 10,341,651 | 10,341,650 | 1 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 0 | 0 | 500,000 | 356,265 | 143,735 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | 0 | 0 | 1,000,000 | 0 | 1,000,000 |
| | | | <u>අත්පත් කර ගැනීම්</u> | | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000 | 0 | **0** | 1,000,000 | 814,584 | 185,416 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,000,000 | 0 | 0 | 5,000,000 | 5,000,000 | 0 |
| | | | <u>මානව සම්පත් සංවර්ධනය</u> | | | | | | |
| 2401 | | 11 | කාර්යය මණ්ඩල පුහුණු | 1,000,000 | 0 | 0 | 1,000,000 | 659,973 | 340,027 |
| | | | එකතුව | 9,500,000 | 7,000,000 | 2,341,651 | 18,841,651 | 17,172,472 | 1,669,179 |

# වැඩසටහන් අනුව වියදම් මූලාශ්‍රකරණ සාරාංශය

ඩී.ජී.එස්.ඒ - 5

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය : 253

| | මූලාශ්‍රකරණය | වැඩසටහන 01 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය 3 | සත්‍ය වියදම 4 | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 164,906,869,800 | 164,497,703,381 | 164,906,869,800 | 164,497,703,381 | 100 |
| 12 | විදේශ ණය | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශ මූලාශ්‍රයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 46,000,000,000 | 45,595,760,188 | 46,000,000,000 | 45,595,760,188 | 99 |
| | එකතුව | 210,906,869,800 | 210,093,463,569 | 210,906,869,800 | 210,093,463,569 | 100 |

## එක් එක් වැඩසටහනක  ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

**ඩී.ජී.එස්.ඒ - 5 (i)**

**(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්වල මූල්‍යකරණය)**

**වියදම් ශීර්ෂ අංකය : 253** **දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය හා නාමය : 1** **මෙහෙයුම් වැඩසටහන**

| | මූල්‍යකරණය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | වැඩසටහනේ එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 117,695,047 | 115,434,744 | 164,789,174,753 | 164,382,268,637 | 164,906,869,800 | 164,497,703,381 |
| 12 | විදේශ ණය | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 0 | 0 | 46,000,000,000 | 45,595,760,188 | 46,000,000,000 | 45,595,760,188 |
| | එකතුව | 117,695,047 | 115,434,744 | 210,789,174,753 | 209,978,028,825 | 210,906,869,800 | 210,093,463,569 |

## අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2017

සටහන (ii)

**වියදම් ශීර්ෂ අංකය: 253** දෙපාර්තමේන්තුවේ නම: විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2017/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2017/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2017/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 25301 | 115,482,539.24 | 57,830,245.64 | 35,617,736.74 | 137,695,048.14 | 137,699,844.14 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | | | | | | |
| i. පොදු තැන්පත් | 6000-0000-00-0016-0103-000 | 1,291,444.50 | 1,083,525.92 | 593,940.63 | 801,859.21 | 801,859.21 |
| | 6000-0000-00-0013-0113-000 | 12,054,986.42 | 11,846,299.70 | 1,875,168.35 | 2,083,855.07 | 2,083,855.07 |
| | 6000-0000-00-0001-0114-000 | 410,000.00 | 420,000.00 | 95,960.00 | 85,960.00 | 85,960.00 |
| | 6000-0000-00-0018-0113-000 | 125.00 | 304,150.00 | 304,025.00 | 0.00 | 0.00 |
| | 6000-0000-00-0019-0032-000 | 0.00 | 1,814,800.00 | 4,179,800.00 | 2,365,000.00 | 2,365,000.00 |
| | 6000-0000-00-0002-0160-000 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| විස්තරය | මුදල (රු:) | | විස්තරය | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | | 2016 | 2017 |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 3,958,703.02 | 203,298.97 | ආයෝජන පොලී -භාණ්ඩාගාර බැදුම්කර | 64,854.88 | - |
| | | | ප්‍රාග්ධන ලාභාලාභ | 663,337.45 | - |
| | | | ඌනතාවය | 3,230,510.69 | 203,298.97 |
| | **3,958,703.02** | **203,298.97** | | **3,958,703.02** | **203,298.97** |

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2017.12.31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | මුදල (රු:) | | විස්තරය | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | | 2016 | 2017 |
| සමුච්චිත අරමුදල | 3,230,510.69 | 203,298.97 | ආයෝජන | - | - |
| (-) ඌනතාවය | (3,230,510.69) | (203,298.97) | | | |
| | - | - | ලැබිය යුතු ආයෝජන පොලී | - | - |
| | - | - | | - | - |

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| වියදම් | මුදල (රු:) | | ආදායම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2016 | 2017 | | 2016 | 2017 |
| | | | පොලී ලැබීම් | | |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 36,509,155 | 11,504,404 | භාණ්ඩාගාර බැඳුම්කර | 12,169,217 | 11,489,535 |
| බැංකු ගාස්තු | - | 200 | ප්‍රාග්ධන ලා/ලාභ ගිණුම | 3,004,372 | - |
| | | | ඌණතාවය (සමුච්චිත අරමුදලට මාරු කිරීම) | 21,335,565 | 15,069 |
| | **36,509,155** | **11,504,604** | | **36,509,155** | **11,504,604** |

**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**
**2017.12.31 දිනට ශේෂ පත්‍රය**

| බැරකම් | මුදල (රු:) | | වත්කම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | **2016** | **2017** | | **2016** | **2017** |
| සමුච්චිත අරමුදල | 145,919,044.06 | 124,688,492.05 | ආයෝජන ගිණුම - භාණ්ඩාගාර බැඳුම්කර | 121,777,430.32 | 121,777,430.32 |
| එකතු කලා අතිරික්තය | (21,335,565.24) | (15,069.35) | | | |
| | 124,583,478.82 | 124,673,422.70 | ලැබිය යුතු ආයෝජන පොළී - භාණ්ඩාගාර බැඳුම්කර | 2,806,048.50 | 2,895,992.38 |
| | **124,583,478.82** | **124,673,422.70** | | **124,583,478.82** | **124,673,422.70** |

## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2017.12.31 අවසන් වර්ෂය සඳහා
## ආදායම් වියදම් ගිණුම

| විස්තරය | 2016<br>( රු. ) | 2017<br>( රු. ) | විස්තරය | 2016<br>( රු. ) | 2017<br>( රු. ) |
|---|---|---|---|---|---|
| දායක මුදල් ආපසු ගෙවීම | 2,475,784.17 | 5,500,946.66 | වර්ෂයට අදාළ දායක මුදල් | 61,607,825.40 | 81,709,939.57 |
| බදු | 3,551,158.46 | 4,847,683.51 | පොළී ආදායම් | 47,375,314.46 | 60,596,043.67 |
| අතිරික්තය | 102,956,197.23 | 131,957,353.07 | | | |
| | **108,983,139.86** | **142,305,983.24** | | **108,983,139.86** | **142,305,983.24** |

## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2017.12.31 දිනට ශේෂ පත්‍රය

| | 2016 ( රු. ) | 2017 ( රු. ) | | 2016 ( රු. ) | | 2017 ( රු. ) | |
|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 1,248,804,325.14 | 1,350,530,396.46 | ආයෝජන වටිනාකම | | 619,278,949.76 | | 639,617,175.66 |
| | | | **ප්‍රවර්තන වත්කම්** | | | | |
| | | | ලැබිය යුතු පොළී | 38,381,214.34 | | 75,985,097.14 | |
| | | | ලැබිය යුතු මුදල් | 276,483.99 | | 4,805,044.46 | |
| | | | හා.නි.ලේ. ශේෂය | 696,478,807.60 | 735,136,505.93 | 768,159,240.04 | 848,949,381.64 |
| **එකතු කලා** අතිරික්තය | 102,956,197.23 | 131,957,353.07 | | | | | |
| | 1,351,760,522.37 | 1,482,487,749.53 | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | | |
| ගෙවිය යුතු බදු | 2,654,933.32 | 6,078,807.77 | | | | | |
| | **1,354,415,455.69** | **1,488,566,557.30** | | | **1,354,415,455.69** | | **1,488,566,557.30** |

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

**ආදායම් වියදම් ගිණුම**

**2017.12.31 න් අවසන් වර්ෂය සඳහා**

| | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| බදු පෙර පොලී ආදායම | | **5,737,834,950** | | 5,372,972,437 |
| අඩු කළා - බදු | | **(83,357,061)** | | - |
| **බදු පසු පොලී ආදායම** | | **5,654,477,889** | | 5,372,972,437 |
| **අඩු කළා - වියදම්** | | | | |
| විදුලිය | **465,078** | | 459,494 | |
| ජලය | **12,136** | | 9,933 | |
| වැටුප් හා වේතන | **10,399,153** | | 9,451,671 | |
| අතිකාල දීමනා | **461,583** | | 313,403 | |
| දීමනා | **57,500** | | - | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල වියදම් | **431,404** | | 29,050 | |
| නිදහස් දුම්රිය බලපත්‍ර | **23,520** | | 88,071 | |
| ක්ෂයවීම් | **25,188** | | 28,912 | |
| වෙනත් වියදම් | **15,495** | | 7,350 | |
| විගණන ගාස්තු | **172,500** | **12,063,558** | 172,500 | 10,560,384 |
| **අතිරික්තය** | | **5,642,414,331** | | 5,362,412,053 |
| එකතු කළා - පොදු සංචිතයෙන් මාරුකිරීම් | | **2,769,293** | | 38,695,396 |
| **දායකයන්ට විසර්ජනය කළ හැකි ආදායම** | | **5,645,183,624** | | 5,401,107,448 |
| **පොලී විසර්ජනය** | | | | |
| අනිවාර්ය දායකත්වය | **2,234,275,558** | | 2,136,134,565 | |
| ස්වේච්ඡා දායකත්වය | **3,468,034** | | 3,291,965 | |
| රජයේ දායකත්වය | **3,405,276,801** | **5,643,020,393** | 3,258,911,625 | 5,398,338,155 |
| **විසර්ජනය කිරීමෙන් හා පොදු සංචිතයෙන් මාරු කිරීමෙන් පසු අතිරික්ත පොලී ආදායම** | | **2,163,231** | | 2,769,293 |

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**
**2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| වත්කම් | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ලීබඩු | **6,697** | | 7,440 | |
| කාර්යාලීය උපකරණ | **92,628** | | 102,921 | |
| පරිඝණක උපාංග | **80,197** | **179,522** | 94,349 | 204,710 |
| ආයෝජන ගිණුම - පිරිවැයට | | **34,050,366,302** | | 47,485,636,426 |
| **ජංගම වත්කම්** | | | | |
| ආයෝජනය පිරිවැයට | **18,870,215,298** | | - | |
| ලැබියයුතු පොලී | **2,229,078,288** | | 1,623,191,785 | |
| ලැබිය යුතු රජයේ දායක මුදල් | **17,403,931** | | 571,964,015 | |
| ගැලපුම් ගිණුම | **29,209,393** | | 27,668,536 | |
| කලින් ගෙවීම් | **141,721** | | 141,721 | |
| ගිණුමේ ශේෂය | **223,640,307** | **21,369,688,938** | 828,898,299 | 3,051,864,356 |
| **මුළු වත්කම්** | | **55,420,234,761** | | 50,537,705,492 |
| **මූලධන හා බැරකම්** | | | | |
| **සමුච්චිත අරමුදල** | | | | |
| අනිවාර්යය දායක මුදල් | **21,479,409,368** | | 19,492,427,748 | |
| ස්වේච්ඡා දායක මුදල් | **33,394,939** | | 30,144,795 | |
| රජයේ දායක මුදල් | **33,418,512,038** | **54,931,316,345** | 30,307,548,483 | 49,830,121,027 |
| **සංචිත** | | | | |
| ප්‍රාග්ධන සංචිත | **3,790** | | 3,790 | |
| පොදු සංචිත | **2,163,231** | **2,167,021** | 2,769,293 | 2,773,083 |
| **ජංගම බැරකම්** | | | | |
| උපචිත විගණන ගාස්තු | **517,500** | | 1,803,741 | |
| නොගෙවන ලද රජයේ ප්‍රසාද මුදල් | **474,425,527** | | 675,936,899 | |
| උපචිත වියදම් | **11,808,369** | **486,751,396** | 27,070,742 | 704,811,382 |
| **මුළු මූලධන සහ බැරකම්** | | **55,420,234,763** | | 50,537,705,492 |